*The Journal of Desk Research Review and Analysis, Vol. 1, Issue II, 2023, 158-183*

# THE TREATY OF 1815? OR THE PROCLAMATION OF THE CONVENTION FOR THE CEYLON SETTLEMENT ACT?

Saman Herath[1]

**Abstract**

This research aimed to investigate the Paper written by the British in 1815 AD called 'Givisuma', in historiography and within the Sinhalese context. In 1815, the paper that the British documented regarding the Ceylon and obtained signatures from elites at Kandy has been attested in various Sinhala language sources as 'Givisuma'. Several scholars have been mentioning this as 'Sammutiya' (Convention). Nevertheless, in this regard, English words included in the primary sources indicate a different Sinhala literal meaning. The paper of 1815 is commonly referred to as the 'Proclamation' in the primary sources and its Sinhala meaning is being ignored in secondary Sinhala language sources and usage among the Sri Lankans. 'Proclamation' means the Sinhala literal meaning of, "Prakasha Pattraya", "Danveem Pattraya". A 'Proclamation' is a formal announcement, usually made by a government or other powerful authority which has been used as a means of expression by the British colonialists and the legal mechanism to affirm the accession of a British king or queen and confirm the right to the lands belonging to the Great Britain. A 'Treaty' is a legal document in international relations. A 'Convention' is a set of rules for parties who agree to a convention to solve a problem that affects a number of people in the world. The components included in a 'Treaty' are called 'Agreements'. Thus, this research seeks to determine the most fitting name for the document proposed in Sri Lanka in 1815 considering its Sinhala language meaning. The Historical Research Method has been used for this research. Considering the medium of expression enforced by the British in their colonies, their content, and the nomenclature given to those expression mediums, the paper written in Ceylon in 1815 has a different meaning than the meaning that emerges from the term 'Treaty'. The findings suggested that, based on historical considerations, the document 1815 in Sri Lanka may be more accurately described as the "The Proclamation of the Convention for the Ceylon Settlement Act, 1815" rather than using the term "1815 treaty (Givisuma)".

Keywords - Proclamation, Convention, Declaration, Treaty, Agreement, Paper of 1815

---

[1]Senior Lecturer, Department of History, University of Kelaniya

Email: samanh@kln.ac.lk https://orcid.org/0000-0001-8704-5727

Accepted the revised version: 02 December 2023

This work is licensed under CC BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

*The Journal of Desk Research Review and Analysis, Vol. 1, Issue II, 2023, 158-183*

# 1815 'ගිවිසුම' ද ? බේරුම්කරණ (නිරවුල්කරණ) පනත පිළිබඳ සම්මේලනයේ ''ප්‍රකාශ පත්‍රය'' ද ?

**සමන් හේරත්**

**සාරසංක්ෂේපය**

1815 දී බ්‍රිතාන්‍යයෝ සකස් කළ ලියවිල්ල 'ගිවිසුමක්' ය යන නමින් ඉතිහාසකරණයේදීත්, ව්‍යවහාරයේදීත් භාවිත වීම පිළිබඳ සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ විය. 1815 දී බ්‍රිතාන්‍යයෝ ලංකාව සම්බන්ධයෙන් ලේඛනගත කර ලාංකික ප්‍රභූන්ගෙන් අත්සන් ලබා ගත් ලියවිල්ල 'ගිවිසුමක්'(Treaty) බව ඇතැම් සිංහල මූලාශ්‍රයවල සඳහන් වේ. බොහෝ විද්වත්හු මෙය සම්මුතිය(Convention) නමින් හඳුන්වති. එහෙත් මේ සම්බන්ධයෙන් ප්‍රාථමික මූලාශ්‍රයන්හි මීට වඩා වෙනස් සිංහල වචනාර්ථ සහිත ඉංග්‍රීසි වචන ඇතුළත් වේ. බහුල වශයෙන් මෙම ලියවිල්ල 'Proclamation' නමින් ප්‍රාථමික මූලාශ්‍රයවල දක්වා ඇති අතර ද්විතීය සිංහල මූලාශ්‍රයවල ද ව්‍යවහාරයේ ද එහි සිංහලාර්ථය නොසැලකා හැර තිබේ. 'Proclamation' යන්නෙන් අදහස් වන්නේ ''ප්‍රකාශ පත්‍රය'', ''දැන්වීම් පත්‍රය'' යන සිංහල වචනාර්ථයන් ය. ''ප්‍රකාශ පත්‍රය'' යනු සාමාන්‍යයෙන් රජයක් හෝ වෙනත් බලධාරී ආයතනයක් විසින් කරන ලද විධිමත් නිවේදනයකි. බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීන්ගේ ප්‍රකාශන මාධ්‍යයක් වන මෙය වර්මානය දක්වා ම බ්‍රිතාන්‍ය රජවරයෙකුගේ හෝ රැජිනකගේ රාජ්‍යත්වයට පත් වීම බලාත්මක කිරීමටත්, ඒ අනුව මහා බ්‍රිතාන්‍යයට අයත් භූමීන්හි අයිතිය තහවුරු කිරීම සඳහාත් යොදා ගන්නා නීත්‍යනුකූල ක්‍රමවේදයයි. 'ගිවිසුමක්' යනු ජාත්‍යන්තර සම්බන්ධතාවල නීත්‍යානුකූල ලිඛිතයකි. සම්මුතියක් යනු ලෝකයේ විශාල පිරිසකට බලපාන ගැටවලුක් විසඳීම සඳහා සම්මුතියට එකඟවන පාර්ශ්වයන් සඳහා වන නීති මාලාවකි. ගිවිසුමක ඇතුළත් වන 'සංරචක' (Components) 'එකඟතා' (Agreement) ලෙස හැඳින් වේ. මේ අනුව 1815 ලංකාවේදී සකස් වූ ලියවිල්ල සිංහල භාෂාර්ථ සැලකිල්ලට ගෙන කුමන නමකින් හැඳින්වීම වඩා උචිත වේද යන්න මෙම පර්යේෂණයෙන් විමර්ශනයට බඳුන් වේ. ඓතිහාසික අධ්‍යයන ක්‍රමවේදය පර්යේෂණ ක්‍රමවේදය ලෙස භාවිත කර ඇත. යටත්විජිත බ්‍රිතාන්‍ය ජාතිකයන් තම යටත්විජිත රටවල බලාත්මක කරන ලද ප්‍රකාශන මාධ්‍යයන්හි අන්තර්ගතය හා ඊට ලබා දී ඇති නාමකරණය අනුව 1815 ලංකාවේ ඇති වූ ලියවිල්ල 'ගිවිසුම' යන සිංහල භාෂාර්ථයෙන් ඉස්මතු වන අදහසට වඩා වූ අර්ථයක් ඉස්මතු වන බවට අදහසක් පර්යේෂණ ප්‍රතිඵලයෙන් ඉස්මතු වේ. ඓතිහාසික සාධක මත ''1815 ගිවිසුම'' නැමැති නාමකරණයට වඩා ''1815 බේරුම්කරණ (නිරවුල්කරණ) පනත පිළිබඳ සම්මේලනයේ ''**ප්‍රකාශ පත්‍රය**'' යනුවෙන් නාමකරණය කළ හැකි බවට වන අදහසක් පර්යේෂණ ප්‍රතිඵල මඟින් යෝජිත ය.

**මුඛ්‍ය පදඃ** *ප්‍රකාශ පත්‍රය, සම්මේලනය, සම්මුතිය, ගිවිසුම, ප්‍රකාශනය, එකඟතාව, 1815 ලියවිල්ල*

## හැඳින්වීම

### අධ්‍යයන පසුබිම

ක්‍රි.ව. 1796 පෙබරවාරි 16 දින ලංකාවේ මුහුදුබඩ පළාත් බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීහු අල්ලා ගත්ත. මේ සමයේ ලංකාවේ පාලන බලකේන්ද්‍රස්ථානය කන්ද උඩරට පැවති අතර 1798 සිට එහි පාලකයා වූයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය. මුහුදුබඩ බලය අල්ලා ගැනීමෙන් පසු බ්‍රිතාන්‍යයෝ රට අභ්‍යන්තයේ පැවති මහනුවර රාජධානිය බිඳ දැමීමට සැලසුම් සකස් කළහ. එම සැලසුම් සාර්ථක වීමේ ප්‍රතිඵලයක් ලෙස 1815 දී මහනුවර රාජධානියේ බලය බිඳවැටීමෙන් ලංකාව බ්‍රිතාන්‍ය යටත්විජිතයක් බවට පත් විය. මෙම සැලසුම් සහගත ක්‍රියාවලිය මෙන් ම ලංකාවේ බෞද්ධ භික්ෂූන්, ඇතැම් රදලවරු හා ඇතැම් සාමාන්‍ය ජනතාවගෙන් බ්‍රිතාන්‍යයන්ට ලැබුණු සහයෝගය ලංකාවේ රාජාණ්ඩුව බිඳ වැටීමට හේතු විය. ලංකාවේ සමස්ත භූමිය යටත් කර ගැනීමෙන් පසු ඒ සම්බන්ධයෙන් 1815 මාර්තු 02 වන දින සමුළුවක් පැවැත්විණි (C.G.G., 6th March, 1815 ; Silva, 1953 ; WILSON, 2016). මෙම සමුළුවෙන් පසුව දින ගණනාවක් පුරාවට වරින් වර ලියවිල්ලක් අත්සන් විය. 1815 ලංකාවේ ඇති වූ ලියවිල්ල නාමකරණයේදී බ්‍රිතාන්‍ය ලේඛකයන් හා ලාංකික ලේඛකයන් භාවිත කර ඇත්තේ කවර නාමයන් ද යන්නත් ලාංකික ලේඛනයන් තුළ ඇතුළත් ඒ නම් ප්‍රාථමික මූලාශ්‍රයෙන් වෙනස් වන්නේ ද, එසේ වෙනස්වනවා නම් ඒ කවරාකාරයෙන් ද යන්නත්, ඒ සම්බන්ධයෙන් එළඹිය හැකි නිෂ්චිතය කුමක් ද යන්නත් සාකච්ඡා කිරීම මෙම පර්යේෂණයේ අන්තර්ගතය වේ.

### පර්යේෂණ ගැටලුව

1815 දී ලංකාවේ සිදු වූ ඓතිහාසික සිදුවීම සෑම වසරක ම ලංකාව යටත්විජිතයක් වීමත් ඉන් නිදහස් වීමත් පිළිබඳ කථිකාවන්හිදී සිහිපත් කෙරේ. 1815 දී බ්‍රිතාන්‍යයන් විසින් සකස් කරන ලද ලියවිල්ල ලේඛනකරණයේදී

මෙන් ම වාච්‍යානුසාරයේදී ගිවිසුමක් ලෙසින් භාවිත වේ. එහෙත් මේ සම්බන්ධ ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය කිරීමේදී බ්‍රිතාන්‍යයන් විසින් ම ලියන ලද එකී ලේඛනයන්හි සඳහන්ව ඇත්තේ 'ගිවිසුම' යන සිංහල අදහස ලබා දෙන ඉංග්‍රීසි වචනයට වඩා ''දැන්වීම් පත්‍රය'', ''නිරවුල් කිරීමේ පනත'', 'සම්මේලනය', 'සම්මුතිය' යන අදහස ලබා දෙන ඉංග්‍රීසි වචනයන් ය. ඉංග්‍රීසි භාෂාවෙන් ලියන ලද වචනය සිංහල භාෂාවෙන් පරිවර්තනය කිරීමේදී 'ගිවිසුම' යනුවෙන් ව්‍යවහාර කිරීම එකී ඓතිහාසික සංසිද්ධිය සහ බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ප්‍රකාශන මාධ්‍ය පිළිබඳ වගවිභාගයකින් තොරව ලේඛනයට සහ ව්‍යවහාරයට බඳුන් වූවක් බව පෙනේ. 1815 ලියවිල්ලෙහි නාමකරණය සම්බන්ධයෙන් විධිමත් පර්යේෂණයක හිඩැසක් පවතින බැවින් එය සම්පූර්ණ කිරීම සඳහා ශාස්ත්‍රීය විමර්ශනයක් කිරීමට අවශ්‍ය වේ. 1815 සකස් වූ ඓතිහාසික ලේඛනය සිංහල භාෂාවෙන් 'ගිවිසුම' නමින් නාමකරණය වීම වඩා නිවැරදි භාවිතයක් ද ? යන ප්‍රශ්නයට පිළිතුරු සපයා ගැනීම පර්යේෂණයෙන් අපේක්ෂිත ය.

**පර්යේෂණ අරමුණ**

බ්‍රිතාන්‍යය පරිපාලකයන්ගේ මූලිකත්වයෙන් සැකසුණු 1815 ලියවිල්ල ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට පරිවර්තනය වීමේදීත්, ව්‍යවහාරයේදීත් භාවිත වන්නේ නිවැරදි ම භාෂාර්ථය දැයි ඓතිහාසික ලේඛන ඔස්සේ විමසා බැලීම පර්යේෂණයේ අරමුණ විය.

**පර්යේෂණ ක්‍රමවේදය**

ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. එහිදී ශ්‍රී ලංකාවේ මහනුවර රාජධානියේ අවසන් පාලන සමය සහ බ්‍රිතාන්‍ය පාලන සමය පිළිබඳ තොරතුරු ඇතුළත් වන දෙස් විදෙස් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පර්යේෂණය සඳහා භාවිත කළේය. ලෝකයේ යටත්විජිත යුගයේදී බ්‍රිතාන්‍යයන් සිය රට තුළත් ඔවුන්ගේ යටත්විජිත තුළත් එකී යටත්විජිත භූමි තමන් සන්තක කරගැනීම සඳහා අනුගමනය කර ඇති ලිඛිතමය ක්‍රමවේදයන් සහ එම ලේඛන බලාත්මක කර ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කර ඇත්තේ කවරාකාර පියවරයන් ද යන්න ගිවිසුම්, ප්‍රකාශ පත්‍ර, සම්මුති සහ එකඟතා යන බලය පවරා ගැනීමේ ලේඛන ක්‍රමවේද නිර්වචනය කර, හඳුනා ගැනීමක් ප්‍රථමයෙන් ඉදිරිපත් වේ. මෙම ලේඛන මාධ්‍ය සඳහා දී ඇත්තේ කුමන නාමකරණයක් ද යන්න පිළිබඳ මෙහිදී විශේෂ අවධානයක් යොමු කර ඇත. පසුව, ඒ පිළිබඳ එකී සිදුවීමට සමකාලීනව ජීවත් වූ රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකරු සහ කන්ද උඩරට තානාපති ජෝන් ඩොයිලි විසින් සහ ආණ්ඩුව මඟින් නිකුත් කරන ලද ගැසට් පත්‍ර, ලිපි ලේඛනාදී ප්‍රාථමික මූලාශ්‍රයන්හි 1815 ලියවිල්ල නාමකරණය කර ඇත්තේ කෙසේදැයි අධ්‍යයනය කරන ලදී. පසුව, ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය පිළිබඳ තොරතුරු සංග්‍රහ කළ ඉංග්‍රීසි ගත්කතුවරුන් මෙකී ලියවිල්ල නාමකරණය කර ඇත්තේ කෙසේද යන්න අධ්‍යයනය කරන ලදී. පසුව, ලංකාවේ පූර්වෝක්ත යුගය සම්බන්ධයෙන් ලියවී ඇති විධිමත් සහ ගැඹුරු පර්යේෂණ මූලාශ්‍රයන්හි ''1815 ලියවිල්ල'' නාමකරණය කර ඇත්තේ කවරාකාරයෙන් ද යන්න විමර්ශනය කරන ලදී. පදගතාර්ථ විශ්ලේෂණය සඳහා දේශීය හා විදේශීය ශබ්දකෝෂ, බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ බ්‍රිතාන්‍යයේ සහ ඉන්දියාවේ ලියවී ඇති ද්විතීයික මූලාශ්‍රය භාවිත කරන ලදී. අවසන් වශයෙන් පදගතාර්ථ මූලික කරගනිමින් ප්‍රාථමික මූලාශ්‍රය සහ ද්විතීයික මූලාශ්‍රයවල 1815 ලියවිල්ල නාමකරණය සම්බන්ධයෙන් ඇති සමවිෂමතා, එකී නාමයන්හි ඇති පදරුත් සහ බ්‍රිතාන්‍යය පාලකයන්ගේ විවිධ ප්‍රකාශන මාධ්‍යයන්හි ලක්ෂණ, සහ 1815 දී සිදු වූ ඓතිහාසික සිදුවීම විශ්ලේෂණය කර නිගමනයට එළඹ තිබේ.

**සාහිත්‍ය විමර්ශන**

**බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීන් භාවිත කළ ප්‍රකාශන මාධ්‍ය හඳුනා ගැනීම**

**'ගිවිසුම' (Treaty) හඳුනා ගැනීම සහ බ්‍රිතාන්‍යයන් සිය යටත්විජිතයන්හි ගිවිසුම් නිකුත් කළ අවස්ථා**

'ගිවිස්' ධාතුව ගිවිසීමෙහි, පොරොන්දුවෙහි, පිළිගැනීමෙහි යන අර්ථයෙන් භාවිත වන අතර 'ගිවිස' යන්න පිළිගත්, පොරොන්දු වූ යන අර්ථයෙන් ද, 'ගිවිස්නා' යන්න පිළිගන්නා, කැමතිවන යන අර්ථයෙන් ද, 'ගිවිසුම්' යන්න ප්‍රතිඥාව යන්නෙන් ද, 'ගිවිසුම් පත්' යන්න පොරොන්දු ලියාගත් පත්‍රය' යන අර්ථයෙන් ද පැරණි ලංකාවේ ව්‍යවහාර විය (ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, ළිතීයභාගය, 1999). සාකච්ඡා මඟින් කරන ලද එකඟතාවක් හෝ විධිවිධානයක් (දේශපාලන අධිකාරීන් දෙකක් හෝ වැඩි ගණනක් අතර ලිඛිත ගිවිසුමක් (ප්‍රාන්ත හෝ ස්වෛරී රාජ්‍යයන් වැනි) නියෝජිතයින් විසින් විධිමත් ලෙස අත්සන් කරන ලද අතර රාජ්‍යයේ නීති සම්පාදන අධිකාරිය විසින් නිසි ලෙස බලය ලත් සහ සාමාන්‍යයෙන් අනුමත කරනු ලැබූ), එවැනි කොන්ත්‍රාත්තුවක් සකස් කර ඇති ලේඛනයක්, ප්‍රතිකාර කිරීමේ ක්‍රියාව සහ විශේෂයෙන් සාකච්ඡා කිරීමේ ක්‍රියාව (*Definition of TREATY*, 2019) හැඳින්වීම සඳහා ද, පුද්ගලික ගිවිසුම් (විකුණුම්කරු සහ ගැනුම්කරුගේ සම්මන්ත්‍රණය මඟින් තීරණය කරනු ලබන කොන්දේසි මත දේපල විකිණීම) (*Merriam-Webster Dictionary*, 2023) හැඳින්වීම සඳහා ද, රටවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර ලිඛිත ගිවිසුමක් (එරටවල නායකයින් විසින් විධිමත් ලෙස අනුමත කර අත්සන් කර ඇති), රජයන් විසින් විධිමත් ලෙස අනුමත කරන ලද රටවල් දෙකක් හෝ කිහිපයක් අතර ගිවිසුමක්,

පුද්ගලයන් දෙදෙනෙකු, සමාගම් හෝ සංවිධාන අතර විධිමත් ගිවිසුමක් (Cambridge Dictionary, 2023) හැඳින්වීම සඳහා ද, රටවල් දෙකක් හෝ කිහිපයක් අතර විධිමත් එකඟතාවක් (*Treaty Noun - Definition, Pictures, Pronunciation and Usage Notes | Oxford Advanced Learner's Dictionary at OxfordLearnersDictionaries.com*, 2022) හැඳින්වීම සඳහා ද, 'සාමය, සන්ධානය, වාණිජ්‍යය හෝ වෙනත් ජාත්‍යන්තර සබඳතා සම්බන්ධයෙන් රාජ්‍ය දෙකක් හෝ කිහිපයක් අතර විධිමත් ගිවිසුමක්' නැතහොත් 'එවැනි ජාත්‍යන්තර ගිවිසුමක් මූර්තිමත් කරන විධිමත් ලේඛනය' හැඳින්වීම සඳහා ද 'Treaty' යන වචනය භාවිත කරයි (*Definition of Treaty | Dictionary.com*, n.d.) සාමාන්‍යයෙන් 'ගිවිසුම' (Treaty) යන පදය වෙන් කර ඇත්තේ වඩාත් බැරෑරුම් ගිවිසුම් අවශ්‍ය වන යම් ගරුගාම්භීර එකඟතා සඳහා ය. මෙම එකඟතාවන්හි අත්සන් සාමාන්‍යයෙන් මුද්‍රා තැබෙන අතර ඒවා සාමාන්‍යයෙන් අනුමත කිරීම අවශ්‍ය වේ.

ගිවිසුමක් යනු ජාත්‍යන්තර සබඳතාවල නීත්‍යානුකූල ලිඛිතයකි (ඔප්පුවකි/සාධන පත්‍රයකි - A treaty, the typical instrument of international relations) සාමාන්‍ය අර්ථයෙන් ගිවිසුමක් වීමට නම් විවිධ නිර්ණායක සපුරාලිය යුතුය. පළමුවෙන්ම, එය බැඳීමේ මෙවලමක් විය යුතුය. එයින් අදහස් වන්නේ ගිවිසුම්කාර පාර්ශවයන් (contracting parties) නීතිමය අයිතිවාසිකම් සහ යුතුකම් නිර්මාණය කිරීමට අදහස් කරන බවයි. දෙවනුව, ගිවිසුම් සෑදීමේ බලය ඇති රාජ්‍යයන් හෝ ජාත්‍යන්තර සංවිධාන විසින් මෙම මෙවලම අවසන් කළ යුතුය. තෙවනුව, එය ජාත්‍යන්තර නීතියෙන් පාලනය විය යුතුය. අවසාන වශයෙන් මෙම බන්දනය (දේපාර්ශ්වයේ බැඳීම) ලිඛිතව විය යුතුය. 'ගිවිසුම' යන්න ගිවිසුම් නීතිය පිළිබඳ 1969 මැයි 23 වන දින සම්මත කරන ලද 1980 ජනවාරි 27 දින සිට බලාත්මක වූ රාජ්‍යයන් අතර ගිවිසුම් පාලනය කරන ජාත්‍යන්තර සම්මුතිය වන වියානා සම්මුතිය මඟින් අර්ථ දක්වා ඇත්තේ "රාජ්‍යයන් අතර ලිඛිත ස්වරූපයෙන් අවසන් කරන ලද සහ ජාත්‍යන්තර නීතිය මඟින් පාලනය වන, තනි විධිමත් ලිඛිතයක් හෝ දෙකකින් හෝ ඊට වැඩි ගණනකින් යුත් ඊට ම අදාළ සුවිශේෂී අභිධානයන් (නියම කිරීම්) අන්තර්ගත වූ එකගතාවක්'' වශයෙනි (*International Agreement | International Relations*, n.d.). වියානා සම්මුතියට පෙර පවා, එහි මතුපිට අර්ථයෙන් 'ගිවිසුම' යන වචනය සාමාන්‍යයෙන් ලිඛිත ස්වරූපයෙන් අවසන් කරන ලද (engagements concluded in written form) කටයුතු සඳහා යොදා ගනු ලැබිණි (United Nations, n.d.). ගිවිසුම් විවිධ ස්වරූපයෙන් සහ විලාසයෙන් නිර්මාණය වේ. ජාත්‍යන්තර ගිවිසුම, රාජ්‍යයන් සහ ඇතැම් ජාත්‍යන්තර සංවිධාන වැනි ජාත්‍යන්තර නීතියේ අනෙකුත් විෂයයන් මඟින් එකී ආයතනයන්ට අදාළ කරුණු නියාමනය කරන මෙවලමකි. නමුත් ඒවා සියල්ල ම පාලනය වන්නේ සම්ප්‍රදායික ජාත්‍යන්තර නීතියේ කොටසක් වන ගිවිසුම් නීතිය මඟිනි (*International Agreement | International Relations*, n.d.).

විවිධාකාර අරමුණු පදනම් කරගනිමින් ගිවිසුම් සකස් වේ. 'ගිවිසුම්' ලෙස නම් කර ඇති ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සාමාන්‍ය නිදසුන් ලෙස සාම ගිවිසුම් (Peace Treaties), දේශසීමා ගිවිසුම් (Border Treaties), සීමා නිර්ණ ගිවිසුම් (Delimitation Treaties), පිටුවහල් කිරීමේ ගිවිසුම් (Extradition Treaties), මිත්‍රත්ව ගිවිසුම් (Treaties of Friendship), වාණිජ්‍යය සහ සහයෝගීතාව පිළිබඳ ගිවිසුම් (Commerce and Cooperation Treaties) දක්නට හැකිය (United Nations, n.d.). නීති සම්පාදක ගිවිසුම් (Lawmaking treaties) යනු පාර්ශ්වයන් ඔවුන්ගේ අනාගත හැසිරීම සඳහා මූලධර්ම (ප්‍රතිපත්ති) හෝ සවිස්තරාත්මක රීති සම්පාදනය කරන මෙවලමකි. මෙම ගිවිසුම් දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලයේ වැඩි වශයෙන් දක්නට ලැබේ. කොන්ත්‍රාත් ගිවිසුම් (Contractual treaties) යනු පාර්ශවයන් විසින් භූමි කොටස් හුවමාරු කර ගැනීමට හෝ ආරවුලක් හෝ හිමිකම් සමථයකට පත් කිරීමට එකඟ වන ගිවිසුම් ය. එනම්, ඒවා යම් ආකාරයක ව්‍යාපාරයක් සමඟ සම්බන්ධ වෙයි.

නිශ්චිත අරමුණක් හෝ විවිධ අරමුණු සඳහා ඇතැම් බහුපාර්ශ්වික එකඟතා නැතහොත් ගිවිසුම් (multilateral agreements) මඟින් ජාත්‍යන්තර සංවිධානයක් පිහිටවනු ලබයි. එබැවින් ඒවා ඡන්දදායක ගිවිසුම් (constituent agreements) ලෙස හැඳින්විය හැකිය. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (1945) බහුපාර්ශ්වික ගිවිසුමක් වන අතර එය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංඝටක (ඡන්දදායක) මෙවලමක් වේ (*International Agreement | International Relations*, n.d.). ජාත්‍යන්තර ව්‍යවස්ථාදායකයක් නොමැති විට, 'බහුපාර්ශ්වික ගිවිසුම' යනු සීඝ්‍ර තාක්ෂණික වර්ධනයන් සහ ජාතීන් අතර දිනෙන් දින වර්ධනය වන අන්‍යෝන්‍ය යැපීම මඟින් ඇති වන වෙනස් වන තත්වයන්ට ජාත්‍යන්තර නීතිය අනුවර්තනය කිරීම සඳහා තෝරා ගත් මෙවලමයි. ජාත්‍යන්තර ගිවිසුම්වල අතිශය විවිධත්වය තිබියදීත්, ඒවා ජාත්‍යන්තර සමාජය තුළ නිර්මාණය කරන කාර්යයන් අනුව වර්ගීකරණය කළ හැකිය. එවැනි පුළුල් කාර්යයන් තුනක් හඳුනාගත හැකිය. එනම්, ජාත්‍යන්තර නීතිය සංවර්ධනය කිරීම සහ

කේතනය කිරීම, රාජ්‍යයන් අතර සහයෝගීතාවයේ සහ ඒකාග්‍රතාවයේ නව මට්ටම් ස්ථාපිත කිරීම සහ සැබෑ සහ විභව ජාත්‍යන්තර ගැටුම් නිරාකරණය කිරීම යි.

යටත්විජිත රාජ්‍යයන් සමඟ බ්‍රිතාන්‍යය යටත්විජිතවාදීන් ගිවිසුම් (Treaty) නමින් සකසා ගත් ගිවිසුම් ගණනාවක් එකී නාමකරණයෙන් ම ඉතිහාසගතව තිබේ. ඒවා ගිවිසුම් නමින් ම වර්තමානයේ ද ව්‍යවහාර වේ. පළමු ඇංග්ලෝ-බුරුම යුද්ධයෙන් පසු එළඹුණු යන්දබෝ ගිවිසුම (Treaty of Yandabo) එවන් ගිවිසුමකි (*Anglo-Burmese Wars | British-Myanmar History | Britannica*, n.d.). 1826 පෙබරවාරි 24 වන දින අත්සන් කළ මෙය බ්‍රිතාන්‍යයන් හා බුරුමය අතර ඇති වූ සාම ගිවිසුමකි. මෙවන් ගිවිසුම් ගණනාවක් බ්‍රිතාන්‍යයන්ගේ ප්‍රධාන ම යටත්විජිතය වූ ඉන්දියාවේදී බ්‍රිතාන්‍යයෝ සහ ඉන්දීය බලධාරීහු සකසා ගත්හ. 1757 පෙබරවාරි 9 වන දින පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමේ රොබට් ක්ලයිව් සහ බෙංගාලයේ නවාබ්වරයා වූ මුහමද් සුරාජ් උද්-දවුලත් සමඟ ඇති වූ අලිනගර් ගිවිසුම (Treaty of Alinagar) (Mehta, 2005 ; *Treaty of Alinagar | Great Britain-India [1757] | Britannica*, n.d.). පළමු ඇංග්ලෝ-මරාත යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස වොරන් හේස්ටින්ස් සහ මහදජි සෙන්දියා සමඟ 1782 මැයි 17 ගිවිසුම්ගත වූ සල්බායි ගිවිසුම (Treaty of Salbai) (Sharma, 2023), 1784 මාර්තු 11 වන දින අත්සන් කළ මැංගලොර් ගිවිසුම (Treaty of Mangalore) (*Project South Asia*, 2008), අලහබාද් ගිවිසුම (Treaty of Allahabad), තෙවන ඇංග්ලෝ-මයිසූර් යුද්ධය අවසානයේ 1792 මාර්තු 18 බ්‍රිතාන්‍ය නැගෙනහිර ඉන්දියා සමාගම වෙනුවෙන් කෝර්න්වාලිස් සාමිවරයා, හයිද්‍රාබාද්හි නිසාම් සහ මරාත අධිරාජ්‍යයේ නියෝජිතයන් සහ මයිසූරයේ පාලක තිප්පු සුල්තාන් අත්සන් කළ සෙරින්ගපටම්නම් ගිවිසුම (Treaty of Seringapatam), ආර්කෝට්වල නවාබ්වරයා වූ අසීම්-උද්-දව්ලා සහ මේජර් ජනරල් ආතර් වෙලස්ලි අතර ඇති වූ මෙම ගිවිසුමේදී නවාබ්වරයා විසින් උතුරු ආර්කෝට් දිස්ත්‍රික්කය, දකුණු ආර්කෝට්, තිරුචිරප්පල්ලි(Tiruchirappalli), මදුරෙයි සහ තිරුනෙල්විල් (Tirunelveli) සමාගම වෙත ලබා දුන් අතර සියලු පරිපාලන බලය ද පැවරූ 1801 ජූලි 26 වන දින සිදු වූ කර්නාටක ගිවිසුම (Carnatic Treaty) (Rajayyan, 1970; John Malcolm, 1826), 1809 අප්‍රේල් 25 බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දීය සමාගම නියෝජනය කරන චාල්ස් ටී. මෙට්කාෆ් සහ පන්ජාබ්හි සීක් රාජධානියේ ප්‍රධානියා වන රංජිත් සිං අතර ඇති වූ 1809 අම්රිට්සාර් ගිවිසුම (Treaty of Amritsar (1809), 1846 අම්රිට්සාර් ගිවිසුම (Treaty of Amritsar (1846) යන ගිවිසුම් මීට තවත් නිදසුන් ය. මරාත සම්මේලනයේ බිඳවැටීමේ තීරණාත්මක පියවරක් වූ ද 1818 දී බටහිර ඉන්දියාවේ පෙෂ්වාගේ ප්‍රදේශ නැගෙනහිර ඉන්දියා සමාගම විසින් ඈඳා ගැනීමට සෘජුව ම හේතු වූ ද (Naravane, 2018; *Treaty of Bassein | United Kingdom-Bājī Rāo II [1802] | Britannica*, n.d.) 1802 දෙසැබර් 31 ඉන්දියාවේ පූනා (වර්තමානයේ පූනේ)හි මරාත පේෂ්වාවරයා වූ දෙවන බාජි රාඕ සහ බ්‍රිතාන්‍යයන් අතර ඇති වූ බාසේන් ගිවිසුම (Treaty of Bassein) (1802), 1846 මාර්තු 9 සික්වරු සහ බ්‍රිතාන්‍යයන් අතර ඇති වූ ලාහෝර් ගිවිසුම (Treaty of Lahore) (Fenech & McLeod, 2014), 1815 දී නේපාලය සහ නැගෙනහිර ඉන්දියා සමාගම අතර අත්සන් කරන ලද අතර 1816 මාර්තු 4 වන විට අනුමත කරන ලද සුගෞලි ගිවිසුම (Treaty of Sugauli) බ්‍රිතාන්‍යයන්ගේ යටත්විජිත පාලන කාලයේ විශේෂිත ගිවිසුම් ය. මෙම ගිවිසුම මඟින් නේපාලය මතභේදයට තුඩු දී ඇති ටෙරායි නොහොත් පහතරට රටෙහි සියලු හිමිකම් ප්‍රතික්ෂේප කෙරිණි (Whelpton, 2008). Treaty of Titalia (“Treaty of Sagauli | British-Nepalese History [1816],” 2019). මෙලෙස බ්‍රිතාන්‍ය ඉන්දියාවේ යටත්විජිත පාලකයන් සහ ඉන්දියානු පාලකයන් අතර ඇති වූ ප්‍රසිද්ධ ගිවිසුම් ගණනාවකි. 1817 ජූනි 1 දින පෙරදිග ඉන්දියා සමාගම සහ පූනේහි පේෂ්වා (පාලකයා) වන දෙවන බාජි රාඕ අතර අත්සන් කළ පූනා ගිවිසුම (Treaty of Poona) ද විශේෂිත ගිවිසුමකි (Naravane, 2018). මෙම ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස නර්මදා ගඟට උතුරින් සහ තුංගභද්‍රා ගඟට දකුණින් පිහිටි භූමි ප්‍රදේශය බ්‍රිතාන්‍යයන් සතු විය. මේ අනුව ‘ගිවිසුමක්’ (Treaty) නම් එය එනමින් ම නම් කිරීමට යටත්විජිත බ්‍රිතාන්‍ය පාලකයන් කටයුතු කර ඇති බව තහවුරු වේ. වැඩි වශයෙන් මෙම ගිවිසුම් සකස් කර ගැනීමේ අවශ්‍යතාව වී ඇත්තේ යුද්ධවලින් පසුව බ්‍රිතාන්‍යයන්ට සහ දේශීය පාලකයන්ට හිමි අයිතිවාසිකම් නිරාකරණය කර ගැනීමම ය. 1857 සිපෝයි කැරැල්ලෙන් පසුව බ්‍රිතාන්‍ය පාලකයන් සහ ඉන්දියානුවන් අතර සකස් වන බැඳීම් හා සම්බන්ධ වන බොහෝ මෙවලම් ‘පනත්’ ලෙසින් සකස්ව තිබේ. බ්‍රිතාන්‍යයන් ඉන්දියානු භූමිය පවරා ගැනීමේදී ‘සම්මුති’ නමින් හඳුන්වන මාධ්‍ය ඔස්සේ සිදු වූ බලය ලබා ගැනීමක් නොවන අතර පාලනයේදී හා නඩත්තුවේදී ඉන්දියාවේ බ්‍රිතාන්‍ය පාලනයෙන් බොහෝ ආධාර හා උපදෙස් පතමින් පවත්වාගෙන ගිය ලංකා රාජ්‍ය යටත් කර ගැනීම වෙනුවෙන් විශේෂ සම්මුතියකට එළඹීමේ අවශ්‍යතාවක් බ්‍රිතාන්‍යයන්ට පැවතියේ යැයි කල්පනා කිරීම කුකුසක් ජනනය කරයි. ඒ අනුව 1815 ඇති වූයේ ගිවිසුමකට වඩා වෙනත් නාමකරණයකින් යුත් ලියවිල්ලක් යැයි නිර්ණය කිරීමට බ්‍රිතාන්‍ය පාලනයේ ඉන්දියානු ඓතිහාසික සාධක උපයෝගී කරගත හැකිය. එනයින් සැලකීමේදී 1815 ලංකා යටත්විජිතය සමඟ ඇති වූ ලියවිල්ල බ්‍රිතාන්‍යයන් 'Treaty' යන්නෙන් නොව 'Proclamation' යනුවෙන් හඳුන්වා ඇත්තේ මන්ද යන්න සැලකිල්ලට බඳුන් විය යුත්තකි. එහෙත් ජාත්‍යන්තර උපකරණ සඳහා ‘ගිවිසුම’ යන පදය භාවිතා කිරීම පසුගිය

දශක කිහිපය තුළ වෙනත් නියමයන්ට පක්ෂව සැලකිය යුතු ලෙස අඩු වී ඇති බව ද මෙහදී සිහිගන්වා ගත යුතුය.

**'ප්‍රකාශ පත්‍රය' (Proclamation) යන්න හඳුනා ගැනීම සහ සිය යටත්විජිතයන්හි බ්‍රිතාන්‍යයන් 'ප්‍රකාශ පත්‍ර' නිකුත් කළ අවස්ථා**

ප්‍රකාශයක් (සාමාන්‍යයෙන්) බැඳීමක් නොවන දැනුම් දීමකි. 'පොදු නැතහොත් නිල නිවේදනයක්,' 'ප්‍රකාශ කිරීමේ ක්‍රියාව', ''ප්‍රකාශ පත්‍රය'' (Proclamation) නමින් අර්ථ ගන්වයි (*Definition of Proclamation | Dictionary.com*, n.d.-b). ප්‍රකාශ කිරීමේ ක්‍රියාව, නිල හෝ පොදු දැනුම්දීම, ප්‍රකාශිත ආඥා පනත, රජුගේ ප්‍රකාශය, ස්තුතිදීමේ ප්‍රකාශය සන්නිවේදනය සඳහා ප්‍රකාශ පත්‍රය භාවිත කරයි. කිසියම් කරුණක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමේ අරමුණින් පුද්ගලයෙකු හෝ සංවිධානයක් විසින් කරනු ලබන විධිමත් ප්‍රසිද්ධ නිවේදනයකි. එය සාමාන්‍යයෙන් අධිකාරී හෝ බලයක් ඇති පුද්ගලයෙකු විසින් සාදනු ලබන අතර එය බොහෝ විට පොදු චරිතයක් හෝ රජයේ නිලධාරියෙකු විසින් කරන ලද නිවේදනයක් විස්තර කිරීමට භාවිතා කරයි. 'ප්‍රකාශ පත්‍රය' යන්න විධිමත් භාවයේ සහ උත්සවශ්‍රීයේ අර්ථයක් දරයි. එය මහජනතාවට පුළුල් ලෙස බෙදා හැරීමට අදහස් කෙරේ. නව නීතියක්, හදිසි තත්ත්වයක් ප්‍රකාශ කිරීමට හෝ යම් සිදුවීමක් හෝ ජයග්‍රහණයක් හඳුනා ගැනීමට 'ප්‍රකාශ පත්‍රය' බොහෝ විට' භාවිතා වේ (*Declaration vs. Proclamation | the Difference - CompareWords*, n.d.). 'ප්‍රකාශ පත්‍රය' යන්න සැමවිට ම 'ධනාත්මක යැයි' යැයි පිළිගැනීමක් නැත. නව නිවාඩු දිනයක් ප්‍රකාශ කිරීම හෝ ඓතිහාසික සිදුවීමක් සැමරීම වැනි ධනාත්මක ප්‍රවෘත්ති ප්‍රකාශ කිරීම සඳහා මෙන් ම හදිසි තත්ත්වයක් ප්‍රකාශ කිරීම හෝ යුධ නීතිය (proclamation of martial law) ප්‍රකාශ කිරීම වැනි සෘණාත්මක නිවේදන සිදු කිරීමට ද ඒවා භාවිත කළ හැකිය. බොහෝ විට 'ප්‍රකාශ පත්‍ර' නිකුත් කර ඇත්තේ ස්ථාපිත කරන 'පරිපාලන ව්‍යුහයක්' (Administrative Structure) ගැන කීමට ය (Canada, 2013d). නිල හෝ විධිමත් ආකාරයෙන් ප්‍රකාශ කිරීම, විවෘත හෝ ප්‍රදර්ශනාත්මක ආකාරයකින් ප්‍රකාශ කිරීම හැඟවීම සඳහා ද මෙම වචනය වැඩි වශයෙන් යොදයි. යම් පාලන ප්‍රදේශයක පාලනයක ආරම්භය ප්‍රකාශ කිරීමේ ක්‍රියා පටිපාටිය නිවේදනය කිරීම 'ප්‍රකාශ පත්‍රය' මඟින් සිදු වේ ('A proclamation is (usually) a non-binding notice.'... 'The procedure of proclaiming the beginning of a rule over a certain ruling territory is called a proclamation.'). රාජ්‍යත්වයට පත් වීම සම්බන්ධයෙන් 'ප්‍රකාශ පත්‍ර' නිකුත් කිරීම මහා බ්‍රිතාන්‍යයේ ඉතා පැරණි සම්ප්‍රදායකි. එරටෙහි නව රාජාණ්ඩුවේ ප්‍රවේශය පිළිබඳ කාරණය ජාතියට ප්‍රකාශයට පත් කෙරෙන්නේ 'ප්‍රකාශ පත්‍රය' මඟිනි (*Proclamations of Accessions of British Sovereigns (1547-1952)*, n.d.). බ්‍රිතාන්‍ය රාජාණ්ඩුවේ පෙර සිටි රජතුමාගේ අභාවයෙන් පසු, ආධ්‍යාත්මික හා ලෞකික ස්වාමිවරුන් නැතහොත් ආගමික පූජකවරුන් සහ පසුගිය රාජාණ්ඩුවේ රහස්‍ය කවුන්සිලයේ (privy Council) සාමාජිකයින් සමඟින් ලන්ඩනයේ නගරාධිපති, නගර සභිකයන් සහ පුරවැසියන් විසින් කඩිනමින් නිකුත් කරන ප්‍රකාශයක් මඟින් නව රජුගේ පත්වීම දැනුම් දෙනු ලැබේ. රාජ්‍යත්වයට පත් වීම ප්‍රකාශ කිරීම 'ප්‍රකාශ පත්‍රයක' මූලික තේමාව වුව ද VII වන හෙන්රි රජු විසින් ප්‍රථම ප්‍රකාශ පත්‍රය නිතුක් කර ඇත්තේ ග්ලූස්ටර්හි ආදිපාදවරයා (වංශාධිපතියා) මිය ගිය බව ප්‍රකාශ කිරීම සඳහා ය (*Proclamations of Accessions of British Sovereigns (1547-1952)*, n.d.). බ්‍රිතාන්‍යයේ 1625 සිට 1952 දක්වා මෙවැනි 'ප්‍රකාශ පත්‍ර' ගණනාවක් නිකුත් විය. මේ කාලපරාසය අතුරින් මුල් යුගයේ ''පෙර රජතුමාගේ අභාවය'' (decease of the previous monarch), ''අත්සන්කරුවන්ගේ ගණන් බැලීම'' (enumeration of the signers), ''නව රාජාණ්ඩුවේ ප්‍රවේශය'' (accession of the new monarch), ''පක්ෂපාතීත්වයේ ප්‍රතිඥාව''(pledge of loyalty), ''අවසාන ආශීර්වාදය'' (final blessing) වැනි තේමාවන් අරමුණු කරගනිමින් 'ප්‍රකාශ පත්‍ර' නිකුත් වූ අතර පසුකාලීනව මෙම අරමුණු තවදුරටත් වෙනස් වී ඇත (*Proclamations of Accessions of British Sovereigns (1547-1952)*, n.d.).

මහා බ්‍රිතාන්‍යයේ පැරණි නිශ්චල දේපල නීති ක්‍රමය තුළ දඩ මුදල් 'ප්‍රකාශ පත්‍රය' සමඟ අය කරනු ලැබිණි (to, 2018). ඉංග්‍රීසි නීතියෙන්, බ්‍රිතාන්‍ය කිරීට මුද්‍රාව යටතේ කරන ලද විධිමත් නිවේදනයක් (රාජකීය ප්‍රකාශනය), සභාවේ සිටින රජු තම යටත් වැසියන් දැනුවත් කිරීම කැමති යම් කරුණක් මෙම 'ප්‍රකාශ පත්‍ර' යන්නෙන් අර්ථවත් කරයි. නිදසුන් ලෙස යුද්ධය ප්‍රකාශ කිරීම, මධ්‍යස්ථභාවය ප්‍රකාශ කිරීම, පාර්ලිමේන්තුව කැඳවීම හෝ විසුරුවා හැරීම හෝ ව්‍යවස්ථාදායකය විසින් බලාත්මක කිරීම, සභාව තුළ රජුගේ අභිමතය පරිදි පවරා ඇති යම් ප්‍රඥප්තියක විධිවිධාන ක්‍රියාත්මක කිරීමට වැනි තත්ත්වය සඳහා ''ප්‍රකාශ පත්‍ර'' භාවිත විය. කිරීටයේ විධායක බලය ඉදිරියට ගෙන යාම සඳහා කරන ලද මේ ආකාරයේ රාජකීය ප්‍රකාශයන් මෙම වචනය හා බැඳී ඇත. විශේෂයෙන් "එහිදී ඒවා පැරණි නීතිවලට පටහැනි නොවන හෝ නව නීති ස්ථාපිත කිරීමට නැඹුරු නොවන

නමුත් එවැනි නීති ක්‍රියාත්මක කිරීමට පමණක් සීමා කරයි" (STEPHEN, 1868 ; Dicey, 1902 ; States. & James Arthur Finch, 1904).

යටත්විජිත යුගයේ බ්‍රිතාන්‍යයෝ සිය මවුරටේ ආධිපත්‍ය තහවුරු කිරීම වෙනුවෙන් පමණක් නොව යටත්විජිත භූමීන්හි අයිතිය ලබා ගැනීම සඳහා මෙම 'ප්‍රකාශ පත්‍ර' නිකුත් කළහ. එවන් අවස්ථාවක් ලෙස, 1641 අයර්ලන්ත කැරැල්ල සහ ඉන් ඇති වූ නොසන්සුන්තාවයෙන් පසු අයර්ලන්ත සිවිල් වැසියන්ට සහ සටන්කරුවන්ට එරෙහිව අයර්ලන්තයේ පදිංචි කිරීම සඳහා වූ 1652 පනත (Act for the settelment of Ireland 1652) මගින් මරණ සහ ඉඩම් රාජසන්තක කිරීම් ඇතුළු දඬුවම් පැනවීමට ප්‍රකාශ කළ 'ප්‍රකාශ පත්‍රය' නිකුත් කිරීම ප්‍රබල නිදසුනකි. අයර්ලන්තයේ මෙම කැරැල්ල හා සම්බන්ධ වන්නේ ඉඩම් සම්බන්ධයෙන් වූ බ්‍රිතාන්‍යයන්ගේ ක්‍රියාකාරකම් ය. ඉඩම් විකිණීම, එම ඉඩම් හිමිකරුවන් යටතේ අයර්ලන්ත වැසියන් කුලී ගොවියන් බවට පත් වීම පමණක් නොව ඇතැම් අයර්ලන්ත සිරකරුවන් බලහත්කාරයෙන් බටහිර ඉන්දීය කොදෙව් වෙත නැව්වලින් යවන ලද අතර එහිදී ඔවුන් බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන්ට අයත් උක් වගාවන්හි ගිවිසුම්ගත සේවකයන් බවට පත් විය (Micheál Ó Siochrú, 2009) ඔවුන්ගේ ගිවිසුම් කාලය අවසන් වූ විට අයර්ලන්ත ජාතිකයන් එක්රැස් වූ වඩාත් ප්‍රසිද්ධ දූපතක් වූයේ මොන්ට්සෙරාට් ය (*Montserrat - the Island in the Caribbean Where St Patrick's Day Is a Holiday*, 2012). ඉඩම් සහ වතු සහතික කිරීම(Assuring), තහවුරු කිරීම(Confirming) සහ නිරවුල් කිරීම (Settling) සම්බන්ධයෙන් මෙවන් පනත් ගණනාවක් ලෝකයේ භූමි කලාප අල්ලා ගැනීමේදී බ්‍රිතාන්‍යයෝ සකස් කළහ. ඒ අනුව, 1652 බේරුම් කිරීමේ පනතේ (Act of Settlement 1662) (Hunt & Phillips Academy, 1905) පෙර නියෝග අනුමත කළ 1657 (බේරුම්) කිරීමේ පනත (Act of Settlement 1657) (*June 1657: An Act for the Assuring, Confirming, and Setling of Lands and Estates in Ireland. | British History Online*, n.d.) වැනි පනත් සුවිශේෂ වේ. බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීන්ගේ භූමි අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේදී අනුගමනය කළ අයර්ලන්තයේ බ්‍රිතාන්‍ය ක්‍රියාකාරකම් හා සමාන ලක්ෂණ ලංකාවේ ද වූ බව දැකිය හැකිය. 1652 පනත සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය ඉතිහාසඥ ජෝන් මොරිල් (John Morrill) දක්වන්නේ මේ පනත සහ ඒ ආශ්‍රිත බලහත්කාර ව්‍යාපාර "ඇතැම්විට නූතන යුරෝපයේ මුල් කාලයේ වාර්ගික පවිත්‍ර කිරීමේ ශ්‍රේෂ්ඨතම ව්‍යායාමය" නියෝජනය කරන බවයි (Sauer, 2014). ලංකාව යටත්විජිතයක් කරගැනීම ම්ලේච්ඡයන් ශිෂ්ට කිරීම සඳහා බ්‍රිතාන්‍යයන් ගත් පියවරක් බවට වන අදහස් පසුකාලීනව ඉදිරිපත් වේ. මේ අනුව ගම්‍ය වන්නේ බ්‍රිතාන්‍යයන් තමන් විසින් කරන අසාධාරණකම් සාධාරණීකරණය කිරීමට 'පවිත්‍ර කිරීම' යන අදහස විකෘති ආකාරයකින් යටත්විජිත සමයේ භාවිත කර ඇති බව සහ තම ම්ලේච්ඡත්වය සාධාරණීකරණය කිරීමේ විදිමත් ක්‍රමයක් ජනගත කිරීමට උත්සුක වූ බවයි.

බ්‍රිතාන්‍යය සත් අවුරුදු යුද්ධය ජය ගැනීමෙන් පසු, උතුරු ඇමරිකාවේ බ්‍රිතාන්‍ය භූමියට නිල වශයෙන් හිමිකම් පෑමට 1763 දී 'රාජකීය ප්‍රකාශ පත්‍රය' III වන ජෝර්ජ් රජු විසින් නිකුත් කරන ලද ලද අතර එය වර්තමාන උතුරු ඇමරිකාවේ ආදිවාසී ප්‍රදේශ යුරෝපීය ජනාවාස කිරීම සඳහා මාර්ගෝපදේශ සකසන ලේඛනයකි (*Royal Proclamation, 1763*, n.d. ; Borrows, John. 1997 ; History.com Editors, 2018). "ඉන්දියානු මැග්නා කාර්ටා" (The Indian Magna Carta) ලෙස හඳුන්වන මෙම රාජකීය ප්‍රකාශය ගිවිසුම් පිහිටුවීමේ ක්‍රියාවලිය සඳහා පදනමක් සකස් කළේය. මෙමගින් උතුරු ඇමරිකාවේ අයිතිය ජෝර්ජ් රජු වෙත පැවරිණි. එහෙත්, ප්‍රකාශනයේ පැහැදිලිව ම සඳහන් වූයේ ආදිවාසී හිමිකම අඛණ්ඩව පවතින බවත්, ගිවිසුමෙන් පවරා දෙන තුරු සියලු ඉඩම් ආදිවාසී ඉඩම් ලෙස සලකන බවත් ය. ප්‍රකාශය මගින් පදිංචිකරුවන්ට ආදිවාසී පදිංචිකරුවන්ගෙන් ඉඩමක් ඉල්ලා සිටීම තහනම් කර ඇත. එය මුලින් කිරීටය විසින් මිල දී ගෙන පසුව පදිංචිකරුවන්ට විකුණනු ලබන්නේ නම් මිස මුල් ජාතීන්ගෙන් ඉඩම් මිලදී ගත හැක්කේ ඔටුන්න හිමියාට පමණක් බව 'රාජකීය ප්‍රකාශයේ' වැඩිදුරටත් සඳහන් වේ.

ගිවිසුම් සෑදීම සාමාන්‍යයෙන් සම්බන්ධ වන්නේ දෙපාර්ශවයකි. යටත්විජිත ප්‍රකාශ පත්‍රයකදී මුල් ජාතිය(එනම්, එම රටේ සිටින මුල් පදිංචිකරුවන්) සහ රජය, දෙපාර්ශවය අතර යම් ආකාරයක කැමැත්තක් පැවතීම අරමුණු කරගනිමින් පළමු ජාතියට යම් ඉඩම් හෝ සම්පත් ලබා ගැනීම සඳහා වන්දි ලබා දීම සිදු කරයි. එසේ වුවත් 1763 රාජකීය ප්‍රකාශ පත්‍රයෙන් ද පැහැදිලි වන්නේ ඇමරිකානු භූමියෙහි හිමිකම් කියාපෑමේ කටයුත්ත සඳහා එම පත්‍රය සැලසුම් කිරීමේදී ද, ලිවීමේදී ද ආදිවාසීගේ ආදානයකින් (input) තොරව බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන් තම අභිමතය මත එය කර ඇති අතර එමගින් පැහැදිලිව ම බ්‍රිතාන්‍ය කිරීටය විසින් ආදිවාසී ඉඩම් පිළිබඳ ඒකාධිකාරයක් ස්ථාපිත කර ඇති බවයි (*Royal Proclamation, 1763*, n.d.). බ්‍රිතාන්‍යයේ ඇමරිකානු යටත්විජිතයේ අධීක්ෂකවරයා වූ සර් විලියම් ජොන්සන් පවා 1763 රාජකීය ප්‍රකාශය, දීර්ඝ කිරීම සහ නයගරාහි ගිවිසුම (Treaty of Niagara) ස්වදේශිකයන්ගේ ස්වෛරීභාවය ප්‍රකාශ කිරීමක් ලෙස නොසැලකූ බව ජෝන්

බැරෝස් සඳහන් කරයි (Borrows, John. 1994). පසුකාලීනව මහජන චීන සමූහාණ්ඩුව ප්‍රකාශයට පත් කිරීමේ 'ප්‍රකාශ පත්‍රය' (Radhey Shyam Chaurasia, 2004) ඉන්දුනීසියාවේ නිදහස ප්‍රකාශ කිරීමේ 'ප්‍රකාශ පත්‍රය' (Walker, 1962; *Vol. 5, No. 2, Sep., 1964 of Journal of Southeast Asian History on JSTOR*, n.d.) වැනි තේමාවන් ඔස්සේ ද පසුකාලීනව 'ප්‍රකාශ පත්‍ර' නිකුත් කිරීම සිදු වූ බව බ්‍රිතාන්‍ය යටත්විජිත බලපෑම් පැවති ආසියා රටවල දක්නට ලැබේ.

II වන එළිසබත් රැජිනගේ රාජපදවිප්‍රාප්තිය ප්‍රසිද්ධ කළේ 'ප්‍රකාශ පත්‍රයක්' (*Preamble (Hansard, 6 February 1952)*, n.d.) භාවිතයෙනි. 2022 දී බලයට පත් වූ III වන චාල්ස් රජු දක්වා ම මෙම 'ප්‍රකාශ පත්‍ර' සකස් කරනු ලබන්නේ බ්‍රිතාන්‍ය නව රජුගේ රාජපදවිප්‍රාප්තිය දැන්වීම සඳහා ය. එමගින් ඉස්මතු වන තවත් අදහසක් නම් මහා බ්‍රිතාන්‍යයේ රාජකීය කිරීටයට අයත් භූමීන් පිළිබඳ අයිතිය නිරවුල් කර තහවුරු කිරීම ය. II වන එලිසබත් රැජිනගේ මිය යාමෙන් පසු III වන චාල්ස් රජු බ්‍රිතාන්‍යයට හා කොමන්වෙල්ත් රාජ්‍යයන්හි රජු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබුවේ ද 2022 සැප්තැම්බර් මස 10 වන දින ලන්ඩනයේ ශාන්ත ජේම්ස් මාලිගයේ රැස් වූ 'රාජ්‍යත්වයට පත් කිරීමේ කවුන්සිලය' (Accession Council) මඟිනි[2] (Davies, 2022; *Proclamation of the Accession of His Majesty the King | the Proclamation of the Accession of His Majesty the King Will Be Held on the Steps of Parliament House on Sunday 11 September 2022. | by SA Government | Facebook*, n.d.). මෙම චාරිත්‍රානුකූල මණ්ඩලය මාලිගයට රැස්වන්නේ රජුගේ හෝ රැජිනකගේ අභාවයෙන් පසුව ය. ඒ අනුප්‍රාප්තිකයා විධිමත් ලෙස 'ප්‍රකාශ පත්‍රයකින්' පත් කිරීමට ය (to make a formal proclamation of the accession of the successor to the throne). පත්කිරීම අනුව 1701 නිරවුල් (බේරුම්) කිරීමේ පනතේ (Act of Settlement 1701) නියමයන්ට අදාළව නව රාජාණ්ඩුව ස්වයංක්‍රීයව සකීය වේ. මෙම 1701 නිරවුල් කිරීමේ පනත යනු ඉංග්‍රීසි සහ අයර්ලන්ත කිරීටයන් ප්‍රොතෙස්ත්‍රන රෙපරමාදු භක්තිකයන් වෙත පමණක් ලබා දුන් 1701 දී සම්මත කරන ලද එංගලන්ත පාර්ලිමේන්තුවේ පනතකි. එනම්, රාජ්‍යත්වය කතෝලිකයන්ට නොව ප්‍රොතෙස්ත්‍රන්ත්‍ර භක්තිකයන්ට පමණක් ලබා දුන් රාජ්‍යත්වයේ උරුමය නිරවුල් කළ පනතකි. 1815 දී සිදු වූයේ බ්‍රිතාන්‍ය අයර්ලන්ත මෙම පනතට අනුව කටයුතු කරමින් ලංකා භූමියේ ආධිපත්‍ය III ජෝර්ජ් රජුට 'ප්‍රකාශ පත්‍රයක්' මඟින් ලබා දීම ය. ජෝන් ඩොයිලි විසින් 1815 ලංකාවේ ලිය වූ ලියවිල්ල "Act of Settlement" නමින් නම් කිරීමට මූලික හේතුව මෙය ලෙස සැලකිය හැකිය.

**'ප්‍රකාශන පත්‍රය' (Declaration) යන්න හඳුනා ගැනීම**

විශේෂයෙන්ම රජයක හෝ සංවිධානයක සැලසුම් පිළිබඳව නිල හෝ විධිමත් ප්‍රකාශයක්; එවැනි ප්‍රකාශයක් කිරීමේ ක්‍රියාවක් ප්‍රකාශනයක්, ලිඛිත හෝ කථන ප්‍රකාශයක්, විශේෂයෙන් මිනිසුන්ට දැනෙන හෝ විශ්වාස කරන දේ ගැන තොරතුරු ලබා දෙන නිල ලිඛිත ප්‍රකාශයක්, මැතිවරණයකදී එක් එක් අපේක්ෂකයා ලබා ඇති ඡන්ද සංඛ්‍යාව පිළිබඳ නිල නිවේදනයක්, ක්‍රිකට් ක්‍රීඩාවේදී සියලු ම ක්‍රීඩකයින් පන්දුවට පහර දීමට පෙර ඉනිමක් අවසන් කිරීමේ ක්‍රියාව (*Declaration Noun - Definition, Pictures, Pronunciation and Usage Notes | Oxford Advanced Learner's Dictionary at OxfordLearnersDictionaries.com*, 2023) ලෙසින් ද, ප්‍රකාශ කිරීමේ ක්‍රියාව; නිවේදනය, ධනාත්මක, පැහැදිලි හෝ විධිමත් ප්‍රකාශයක් (https://www.dictionary.com/browse/declaration) ලෙසින් ද, ඔබ කොපමණ මුදලක් උපයන හෝ ඉතිරි කර ඇත්ද යන්න පිළිබඳ විස්තර සපයන ප්‍රකාශයක් (Cambridge Dictionary, 2023) ලෙසින් ද, නිවේදනය, පොදු නීති ක්‍රියාවක පළමු ආයාචනය, නීත්‍යානුකූල ගනුදෙනුවකට පාර්ශ්වයක් විසින් කරන ලද ප්‍රකාශයක් (සාමාන්‍යයෙන් දිවුරුම් දීමක් නොවේ), ප්‍රකාශ කරන දෙයක්, එවැනි ප්‍රකාශයක් අඩංගු ලේඛනයක් ලෙසින් ද, 'ප්‍රකාශනය' යන්න අරුත් විග්‍රහ වේ (*Definition of DECLARATION*, n.d.).

නිල නිවේදනයක් නිකුත් කිරීමේදී, බොහෝ විට එකිනෙකට හුවමාරු වන වචන දෙකක් තිබේ. එනම්, 'ප්‍රකාශ පත්‍රය' සහ 'ප්‍රකාශනය' යන්නයි. කෙසේ වෙතත්, මෙම වචන දෙක අතර සියුම් වෙනස්කම් තිබේ. 'ප්‍රකාශ පත්‍රය' සහ 'ප්‍රකාශනය' යන වචන දෙක ම නිල නිවේදනයක් හෝ ප්‍රකාශනයකට යොමු වන නාම පද වේ. 'ප්‍රකාශනය' යනු තම අදහස්, විශ්වාසයන් හෝ අභිප්‍රායන් ප්‍රකාශ කිරීම සඳහා පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කණ්ඩායමක් විසින් කරන ලද විධිමත් ප්‍රකාශයකි. ප්‍රකාශනය යනු ඕනෑම ආකාරයක නිල ප්‍රකාශයක් හෝ නිවේදනයක් විස්තර කිරීමට භාවිතා කළ හැකි වඩාත් පොදු යෙදුමක් බවට ද අදහස් මතු වේ. එය සාමාන්‍යයෙන් ලිඛිතව සාදා ඇති අතර නිශ්චිත අසා සිටින පිරිස (සභාව) (specific audience) විසින් කියවීමට අදහස් කෙරේ. ප්‍රකාශන බොහෝ විට භාවිත කරනුයේ ස්වාධීනත්වය තහවුරු කිරීමට, යුද්ධය ප්‍රකාශ කිරීමට හෝ නියමය(මූලධර්මය) (principles)

[2] මෙම කවුන්සිලය 1603 දී පළමුවන ජේම්ස් රජුගේ සිට සෑම ඉංග්‍රීසි රජෙකු විසින් ම තහවුරු කර ඇත.

හෝ ප්‍රතිපත්ති(ක්‍රියාමාර්ග/ප්‍රතිපදාව) (policies) ප්‍රකාශයක් කිරීමට ය. ප්‍රකාශ පත්‍රය සහ ප්‍රකාශනය යන දෙක ම විධිමත් ප්‍රකාශයන් වන අතර, ඒවා ඒවායේ අරමුණ, විෂය පථය සහ ප්‍රතිග්‍රහණ පිරිස (audience) අනුව ඒවා වෙනස් වේ.

**'සම්මුතිය' (Convention) යන්න හඳුනා ගැනීම**

'සම්මත' යන්න වදන කල්පනා කළ, පිළිගත්, ගරු බුහුමන් කළ, තෝරාගත්, පිළිගැනීම, අනුමතිය, නියමය, ආඥාව යන අර්ථය දීම සඳහා ද, 'සම්මති' යන්න අනුමතිය, පිළිගැනීම, කැමැත්ත, බහුමන, නියෝග යන අර්ථය දීම සඳහා ද, 'සම්මුති' යන වදන අනුමැතිය, පිළිගැණීම, කිසියම් වාක්‍යයක් කියා සම්මත කරගැනීම යන අර්ථය දීම සඳහා ද පැරණි සිංහලයේ භාවිත විය (ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, ඞිතීයභාගය, 1999). පොදු සැලකිල්ලක් ඇති විශේෂිත කරුණු සාකච්ඡා කිරීම සහ ක්‍රියා කිරීම සඳහා සාමාජිකයන්, නියෝජනය කරන්නන් (representatives), හෝ නියෝජිතයන් (delegates) ලෙස විශාල විධිමත් රැස්වීමක් හෝ එකතුවක් යන්න සම්මුතිය (Convention) යන වදනින් අදහස් කරයි (*Definition of Convention | Dictionary.com*, n.d.)' සාමාන්‍යයෙන් යමක් කරන ක්‍රමයක් (a way in which something is usually done) අරුතින් ද, විශේෂිත කරුණු ආවරණය වන රාජ්‍යයන් අතර එකඟතාවක්; විශේෂයෙන් ගිවිසුමකට වඩා අඩු විධිමත් වූවක් යන (an agreement between states covering particular matters, especially one less formal than a treaty) අරුතින් ද, විශේෂයෙන් දේශපාලන පක්ෂයක හෝ විශේෂිත වෘත්තියක හෝ කණ්ඩායමක සාමාජිකයින්ගේ විශාල රැස්වීමක් හෝ සම්මන්ත්‍රණයක් යන අරුතින් ද (Google, 2023), විශේෂිත රැකියාවක් කරන පුද්ගලයන් හෝ ඒ හා සමාන අභිරුචියක් ඇති පුද්ගලයින්ගේ විශාල විධිමත් රැස්වීමක් හෝ දේශපාලන පක්ෂයක් සඳහා විශාල රැස්වීමක් (Cambridge Dictionary, 2019) යන අරුතින් ද, එකඟතාව, පොරොන්දු පත්‍රය, සියල්ලට ම බලපාන කරුණු නියාමනය කිරීම සඳහා රාජ්‍යයන් අතර එකඟතාවක්, විශේෂයෙන්ම සිරකරුවන් හුවමාරු කර ගැනීම හෝ සටන් විරාමය සම්බන්ධයෙන් විරුද්ධ අණ දෙන නිලධාරීන් අතර සම්මුතියක්, මූලික මූලධර්ම හෝ ක්‍රියාපටිපාටි පිළිබඳ සාමාන්‍ය එකඟතාවක් මෙන් ම සම්මුතිය මගින් සත්‍ය හෝ නිවැරදි යැයි පිළිගත් මූලධර්මයක් හෝ ක්‍රියා පටිපාටියක්, රැස්වීමක් කැඳවීම හෝ පහසුකම් සැකසීමක්, පොදු අරමුණක් සඳහා රැස් වූ පුද්ගලයන්ගේ රැස්වීමක් විශේෂයෙන් වේදිකාවක් සකස් කිරීම සහ තනතුරු සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීම සඳහා දේශපාලන පක්ෂයක නියෝජිතයින්ගේ රැස්වීමක්, ආගමික නිකායක සාමාන්‍යයෙන් රාජ්‍ය හෝ ජාතික සංවිධානය, භාවිතය හෝ චාරිත්‍රය විශේෂයෙන් සමාජ කාරණාවලදී, හැසිරීමේ රීතියක්, කාඩ් ක්‍රීඩාවක හවුල්කරුවන් අතර තොරතුරු ලබා දෙන ලංසු තැබීමේ හෝ ක්‍රීඩා කිරීමේ පුරුද්දක්, ස්ථාපිත තාක්ෂණයක්, පුහුණුවක් හෝ උපාංගයක් (රංග ශාලාවේ මෙන්) යනුවෙන් ද (*Definition of CONVENTION*, n.d.), වෘත්තියක, දේශපාලන පක්ෂයක සාමාජිකයින්ගේ විශාල රැස්වීමක් (*Convention Noun - Definition, Pictures, Pronunciation and Usage Notes | Oxford Advanced American Dictionary at OxfordLearnersDictionaries.com*, 2023) 'සම්මුතිය' යන වචනයේ අදහස වේ. 'සම්මුතියක්' යනු පාර්ලිමේන්තුවේ යමක් කළ යුතු ආකාරය පිළිබඳ ලිඛිතව අවබෝධ කර ගැනීමක් වන අතර එය නීත්‍යානුකූලව බලාත්මක කළ නොහැකි වුව ද, විශ්වීය වශයෙන් පාහේ නිරීක්ෂණය කරනු ලබන්නකි (UK Parliament, 2020) 'සම්මුතිය' යන පොදු පදය 'ගිවිසුම' යන පොදු පදයට සමාන බවට ද අදහස් ඉදිරිපත් වේ (*United Nations Treaty Collection*, n.d.).

විවිධ වූ රැස්වීම් නාමකරණය සඳහා 'සම්මුතිය' (Convention) යන නාමය ඓතිහාසිකව භාවිත විය. 1597 දී ඇති වූ මල්වාන සම්මුතිය **(Convention of Malvana)** පෘතුගීසීන් සහ ලංකාවේ ස්වදේශික ප්‍රධානීන් අතර ඇති කරගත් එකඟතාවකි. ප්‍රධානීන් පෘතුගාලයේ රජුට පක්ෂපාතී බවට දිවුරුම් දුන් අතර, ඒ වෙනුවට, ඔවුන්ගේ නීති සහ සිරිත් විරිත් උල්ලංඝනය නොවන බවට සහතික විය. ලංකා ජනතාව සිය නව පරමාධිපත්‍යයට සියලු සාම්ප්‍රදායික සේවාවන් සහ බදු ගෙවිය යුතු බවට ද මෙම සම්මුතියෙන් කටයුතු සකස් විය. පෘතුගීසීන් ලංකාවේ පාලනය භාර ගත් පසු කැඳවන ලද සමුළුවේ අරමුණ වූයේ පෘතුගීසීන් විසින් ලංකාව අත්පත් කර ගැනීම සඳහා නීත්‍යානුකූල භාවයේ වේශයක් ලබා දීමයි (*Convention of Malvana | Portuguese-Ceylonese, Diplomatic, Treaty | Britannica*, n.d.). 1779 ජනවාරි 13වන දා ඇති වූ වඩ්ගෝන් සම්මුතිය (Convention of Wadgaon) ඉන්දියාවේ පළමු මරාතා යුද්ධයෙන් (1775-82) පසුව අවසන් කරන ලද අතර මෙමගින් මරාතයන්ගේ කටයුතුවලට මැදිහත් වීමට බ්‍රිතාන්‍යයන් ගත් උත්සාහයේ අවසානය සනිටුහන් කළේය (*Convention of Wadgaon | Marathas, Treaty, 1779 | Britannica*, n.d.). ජාතික සම්මුතිය, ජාතික ප්‍රංශ සම්මුතිය යනු ප්‍රංශ විප්ලවයේ අතිශය තීරණාත්මක කාල පරිච්ඡේදයේදී, එනම්, 1792 සැප්තැම්බර් 20 සිට 1795 ඔක්තෝබර් 26 දක්වා ප්‍රංශය පාලනය කළ සමූහයයි (සංගමය/එකතුව). රාජාණ්ඩුව පෙරලා දැමීමෙන් පසු (1792 අගෝස්තු 10) රටට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැපයීම සඳහා ජාතික සම්මුතිය තේරී පත් විය. මෙම සම්මුතියට ව්‍යාපාරිකයන්, වෙළඳුන් සහ බොහෝ වෘත්තිකයන් ඇතුළු නියෝජිතයින් 749ක් ඇතුළත් විය. එහි මුල් ක්‍රියාවන්

අතර රාජාණ්ඩුව විධිමත් ලෙස අහෝසි කිරීම (සැප්තැම්බර් 21) සහ ජනරජය පිහිටුවීම (සැප්තැම්බර් 22) සිදු විය. ප්‍රතිවිරුද්ධ විප්ලවවාදී කණ්ඩායම් දෙකක් වන මොන්ටැග්නාඩ් සහ ගිරොන්ඩින් අතර අරගලය සම්මුතියේ පළමු අදියරේ ආධිපත්‍යය දැරීය (The Editors of Encyclopedia Britannica, 2018).

එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරන ලද සම්මුතිය 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්මුතිය' ලෙස හඳුන්වයි. මෙම සමුළුව ෆිලඩෙල්ෆියාහි පෙන්සිල්වේනියා ප්‍රාන්ත මන්දිරයේදී 1787 මැයි 25 සිට සැප්තැම්බර් 17 රැස් විය. මෙහි අරමුණ වූයේ සම්මේලනයේ වගන්ති සංශෝධනය කිරීමයි (amend the Articles of Confederation) (The Editors of Encyclopedia Britannica, 2019). ව්‍යවස්ථා සම්මුති යනු මෙලෙස ව්‍යවස්ථා සම්බන්ධයෙන් ඇති වූ සම්මුතීන් ය (The Editors of Encyclopedia Britannica, 2019). එක්සත් ජනපද ඉතිහාසයේ, 1786 සැප්තැම්බර් මාසයේදී මේරිලන්ඩ්වල ඇනපොලිස්හි පැවති ප්‍රාදේශීය රැස්වීම (regional meeting) හැඳින්වීමට 'සම්මුතිය' යන වචනය භාවිත විය (The Editors of Encyclopedia Britannica, 2017). ඇනපොලිස් සම්මුතිය (Annapolis Convention) යනුවෙන් හැඳින්වූ මෙය ෆෙඩරල් සම්මුතියක් සඳහා වූ ව්‍යාපාරයේ වැදගත් පෙළගැස්වීමේ ලක්ෂ්‍යයක් විය. මේ අනුව ප්‍රාදේශීය රැස්වීමක් හැඳින්වීමට 'සම්මුතිය' යන වචනය භාවිත කර ඇති බව පෙනේ. එක්සත් ජනපද ඉතිහාසයේ දක්නට ලැබෙන හාර්ට්ෆෝර්ඩ් සම්මුතිය (Hartford Convention) (දෙසැම්බර් 15, 1814-ජනවාරි 5, 1815), ජේම්ස් මැඩිසන්ගේ වෙළඳ ප්‍රතිපත්ති සහ 1812 යුද්ධයේ ප්‍රගතිය සම්බන්ධයෙන් නොසතුටු වූ ෆෙඩරල්වාදී නියෝජිතයන්ගේ රහසිගත රැස්වීමකි ("Hartford Convention | United States History | Britannica," 2020). එක්සත් ජනපදයේ විශාලතම බැප්ටිස්ට් කණ්ඩායම වන දකුණු බැප්ටිස්ට් සම්මුතිය උතුරු බැප්ටිස්ට්වරුන්ගේ වහල්භාවයට එරෙහි ආකල්ප හා ක්‍රියාකාරකම් සමග එකඟ නොවූ දක්ෂිණ බැප්ටිස්ට්වරුන් විසින් 1845 දී ජෝර්ජියාවේ ඔගස්ටාහිදී සංවිධානය කරන ලද්දකි ("Southern Baptist Convention | American Religious Organization," 2019). එක්සත් ජනපදයේ 1853 සැප්තැම්බර් 6-7 දින නිව්යෝර්ක් නගරයේ පැවති මැර සම්මුතිය (Mob Convention) තවත් ඓතිහාසික සම්මුතියකි. විධිමත් කාන්තා අයිතිවාසිකම් සම්මුතිය ලෙස හැඳින්වෙන මෙමගින් කාන්තා ඡන්ද අයිතිය පිළිබඳ රැස්වීම සිදු විය (*Mob Convention | United States History | Britannica*, n.d.). සාහිත්‍ය හා කලාත්මක කෘති ආරක්ෂා කිරීම සඳහා විධිමත් ජාත්‍යන්තර සම්මුතිය ලෙස හඳුන්වන බර්න් සම්මුතිය **(Berne Convention)** ජාත්‍යන්තර ප්‍රකාශන හිමිකම් ගිවිසුම (Agreement) 1886 දී බර්න් (බර්න්) හි පැවති ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් මගින් සම්මත කරන ලද අතර පසුව කිහිප වතාවක් වෙනස් කරන ලදී (බර්ලින්, 1908; රෝමය, 1928; බ්‍රසල්ස්; , 1948; ස්ටොක්හෝම්, 1967; සහ පැරිස්, 1971). සම්මුතියේ අත්සන් කරන්නන් බර්න් ප්‍රකාශන හිමිකම් සංගමය පිහිටුවා ඇත (*Berne Convention | Copyright Law*, n.d.).

1830 ගණන්වල එක්සත් ජනපදයේ මෙම සම්මුතීන් වර්ධනය විය ("Political Convention | American Politics | Britannica," 2019). 1864 දී ඩෙන්මාර්කයෙන් ෂෙලස්විග් සහ හොල්ස්ටීන් යන ආදිපාදවරුන් අල්ලා ගැනීමෙන් පසුව, 1865 අගෝස්තු 20 වන දින ඔස්ට්‍රියාව සහ ප්‍රෂියාව අතර එකඟතාවයකට එළඹුණු අතර මෙය ගැස්ටීන් සම්මුතිය (Convention of Gastein) නැතහොත් බොගස්ටීන් සම්මුතිය (Convention of Badgastein) ලෙස හැඳින්වේ. මෙමගින් ජර්මනියේ ආධිපත්‍යය සඳහා මොවුන් අතර පැවති අවසාන අරගලය තාවකාලිකව කල් දැමීය. ගිවිසුම මගින් ඔස්ට්‍රියාවේ අධිරාජ්‍යයා සහ ප්‍රසියාවේ රජු යන දෙදෙනා ම ආදිපාදවරුන් කෙරෙහි ස්වෛරී විය යුතු බවත්, ප්‍රෂියාව ෂෙල්ස්විග් පාලනය කරන බවත්, ඔස්ට්‍රියාව හොල්ස්ටයින් පරිපාලනය කරන බවත් දැක්විණි. ඒ අනුව ඒකාබද්ධ පරිපාලනයක් මින් ගොඩනැගුවේය (*Convention of Gastein | Austrian-Prussian, 1820s, Peace Treaty | Britannica*, n.d.). ඇල්කොක් සම්මුතිය, මහා බ්‍රිතාන්‍යය සහ චීනය අතර 1869 දී සාකච්ඡා කරන ලද වෙළඳාම සහ රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා පිළිබඳ ගිවිසුමකි. ඇල්කොක් සම්මුතිය ක්‍රියාත්මක කිරීම දෙරට අතර සබඳතා අතීතයට වඩා සාධාරණ පදනමක් මත තැබීමට ඉඩ තිබුණි. බ්‍රිතාන්‍ය රජය විසින් එය ප්‍රතික්ෂේප කිරීම බටහිර දෙසට සහනශීලී ප්‍රතිපත්තියක් වෙනුවෙන් පෙනී සිටි චීනයේ ප්‍රගතිශීලී බලවේගවල බලය දුර්වල කළේය. රදර්ෆර්ඩ් ඇල්කොක් විසින් බ්‍රිතාන්‍යයන් සඳහා සාකච්ඡා කරන ලද මෙම සම්මුතියෙන් දෙවන අබිං යුද්ධය ලෙස හැඳින්වෙන වෙළඳ ගැටුමෙන් පසු චීනයට බලකෙරුණු තියැංජිං ගිවිසුම (Tianjin) (Tientsin, 1858) සංශෝධනය කිරීමට අදහස් කෙරිණි. මෙම සම්මුතිය බ්‍රිතාන්‍ය විසින් අත්පත් කරගෙන සිටින හොංකොං හි කොන්සල් කාර්යාලයක් විවෘත කිරීමට සහ සේද සහ අබිං සඳහා කලින් නියම කර තිබූ ඉතා අඩු රාජකාරි වැඩි කිරීමට චීනයට අයිතිය ලබා දුනි. බ්‍රිතාන්‍යයන්ට බදු සහන, සියලුම චීන අභ්‍යන්තර ජල මාර්ගවල වාෂ්ප නොවන යාත්‍රා කිරීමේ අයිතිය සහ චීනය තුළ තාවකාලික පදිංචිය වරප්‍රසාද ලබා ගැනීමට ඉඩ තිබුණි, නමුත් ඔවුන්ට චීනය වෙනත් අයට ලබා දෙන ඕනෑම වරප්‍රසාදයක් ලබා ගත් ඔවුන්ගේ වඩාත්ම හිතකර ජාතියට සැලකීම අත්හැරීමට සිදු වනු ඇති බවට මෙමගින් අදහස් කෙරිණි. හොංකොං හි චීන කොන්සල්වරයා බ්‍රිතාන්‍ය වෙළෙන්දන්ගේ ඔත්තුකරුවෙකු ලෙස ක්‍රියා කරන බවටත් චීනයේ වෙළෙන්දන්ගේ

ලාභය පහත වැටීම චීන රජය විසින් ඔවුන්ට කරන ලද අනවශ්‍ය බාධාවන්ගේ ප්‍රතිඵලයක් බවටත් විරෝධය පළ කරමින් බ්‍රිතාන්‍ය වෙළඳුන් ගිවිසුමට දැඩි විරෝධය පළ කළහ. චීන රජයට තවත් සහන ලබාදිය යුතු බව ඔවුන්ගේ අදහස විය. චීන ජාතිකයන් විසින් විදේශීය ජාතිකයන් කිහිප දෙනෙකු (ප්‍රංශ කන්‍යා සොහොයුරියන් 10 දෙනෙකු ඇතුළුව) මරා දැමූ ටියැන්ජින් සංහාරය පිළිබඳ පුවත්, ගිවිසුමට විරුද්ධ වීමට බ්‍රිතාන්‍යයන්ට ඒත්තු ගැන්වීමට උපකාරී වූ අතර ස්වදේශ කාර්යාලය එය අනුමත කිරීම ප්‍රතික්ෂේප කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ටියැන්ජින් ගිවිසුම වැනි "අසමාන ගිවිසුම්" මගින් චීන-බටහිර සබඳතා දිගටම පාලනය විය (*Alcock Convention | Sino-British Treaty, Diplomatic Relations & Trade | Britannica*, n.d.). 1848 ජූලිවලදී සෙනෙල්කා ෆොල් සම්මුතිය ඇති වූයේ එක්සත් ජනපදයේ කාන්තා ඡන්ද අයිතිය හා බැඳුණු ව්‍යාපාරය සම්බන්ධයෙනි (The Editors of Encyclopaedia Britannica, 2019). ආගම හා බැඳුණු ඇමරිකා ඉන්ටර්නැෂනල් ඉන්කෝපරේෂන්හි හෙවත් ජාතික බැප්ටිස්ට් සම්මුතිය(1895), ඇමරිකාවේ ජාතික බැප්ටිස්ට් සම්මුතිය, විදේශ දූත බැප්ටිස්ට් සම්මුතිය (1880), ඇමරිකානු ජාතික බැප්ටිස්ට් සම්මුතිය (1886), සහ බැප්ටිස්ට් ජාතික අධ්‍යාපන සම්මුතිය (1893) වැනි ඓතිහාසික සම්මුති බිහි විය.

20 වන ශතවර්ෂයේ දී 'සම්මුතිය' යන පදය ද්විපාර්ශ්වික ගිවිසුම් සඳහා වැඩි වශයෙන් භාවිතා වී ඇති අතර වර්තමානයේ එය පුළුල් පාර්ශව ගණනාවක් සමග විධිමත් බහුපාර්ශ්වික ගිවිසුම් සඳහා සාමාන්‍යයෙන් භාවිතා වේ (*United Nations Treaty Collection*, n.d.). සම්මුතීන් සාමාන්‍යයෙන් ජාත්‍යන්තර ප්‍රජාව විසින් සමස්තයක් වශයෙන් හෝ රාජ්‍යයන් විශාල සංඛ්‍යාවකගේ සහභාගීත්වය සඳහා විවෘත වේ. දේශපාලනයේදී 'Convention' යන්න 'සමුළුව' හැඳින්වීම සඳහා භාවිත කරයි. 'දේශපාලන සමුළුව' (Political convention) යනු එවැනි ප්‍රසිද්ධ යෙදුමකි. මෙමඟින් අදහස් කෙරෙන්නේ තනතුරු සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීමට සහ පක්ෂ ප්‍රතිපත්ති තීරණය කිරීමට ප්‍රාදේශීය, ප්‍රාන්ත, පළාත් හෝ ජාතික මට්ටමින් දේශපාලන පක්ෂයක නියෝජිතයින්ගේ රැස්වීමයි. 1952 විශ්ව ප්‍රකාශන හිමිකම් සම්මුතිය (Universal Copyright Convention, 1969 ගිවිසුම් නීතිය පිළිබඳ වියානා සම්මුතිය, 1972 ඇති වූ ජීව විද්‍යාත්මක අවි සම්බන්ධ සම්මුතිය (Biological Weapons Convention (BWC), ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය, සාමාන්‍යයෙන් ජාත්‍යන්තර සංවිධානයක අනුග්‍රහය යටතේ සාකච්ඡා කෙරෙන අවස්ථාවන්හි සම්මුතීන් බිහි වේ. 1982 මුහුදේ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය, 1992 ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය වැනි සම්මුතීන් එවැනි සම්මුතීන්ට නිදසුන් ය.

### 'ගිවිසුම' (Treaty) සහ 'සම්මුතිය' (Convention) අතර වෙනස හඳුනා ගැනීම

ගිවිසුම යනු ගිවිසුම අත්සන් කරන පාර්ශ්වයන්ට බලපාන ගැටලුවක් විසඳීම සඳහා පාර්ශව දෙකක් හෝ වැඩි ගණනක් අතර ඇති ගිවිසුමයි. සම්මුතියක් යනු ලෝකයේ විශාල කොටසකට බලපාන ගැටලුවක් විසඳීම සඳහා සම්මුතියට එකඟ වන පාර්ශ්වයන් සඳහා වන නීති මාලාවයි. අන්තර්ජාතික වශයෙන් ඇති වූ ප්‍රසිද්ධ සම්මුතියක් වන වියානා සම්මුතිය හැඳින්වීම සඳහා භාවිත කර ඇත්තේ Vienna Covention යන පදයයි (United Nations Treaty Collection, Vol. 500. Vienna Convention. In un.org/ola. from https://legal.un.org, retrieved 26/10/2023 check with printout). ගිවිසුමට සම්බන්ධ පාර්ශ්වයන් මෙම ගිවිසුම අත්සන් කළ වහාම බලාත්මක වේ. සම්මුතියක් ලෝකයේ විශාල කොටසකට බලපාන බැවින්, එය බලාත්මක වන්නේ අවම පාර්ශවයන් සංඛ්‍යාවක් සම්මුතියට එකඟ වූ විට පමණි. බොහෝ විට ගිවිසුමක් කෙටුම්පත් කර ක්‍රියාත්මක කරනු ලබන්නේ ඊට සම්බන්ධ පාර්ශ්වයන් විසිනි. සම්මුතියක් කෙටුම්පත් කර ක්‍රියාත්මක කරනු ලබන්නේ "එක්සත් ජාතීන්", ජාත්‍යන්තර සමුද්‍ර සංවිධානය හෝ ජාත්‍යන්තර කම්කරු සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතනයක් විසිනි (*Treaty and Convention, How These Two Are Different ? - MySeaTime*, n.d.).

ලංකාවේ ද්විතීයික මූලාශ්‍රයවල 'සම්මුතිය' යන්න 1815 ලියවිල්ල නාමකරණය සඳහා භාවිත කර තිබුණ ද ප්‍රාථමික මූලාශ්‍රයන්හි එම වචනය භාවිත කිරීම ඉතා විරල ය. ගිවිසුම යන සිංහල වචනයේ වඩාත් සමීප ඉංග්‍රීසි පරිවර්තනය වන 'Treaty' යන්න ප්‍රාථමික මූලාශ්‍රයක භාවිත වී ඇත්තේ එකී මූලාශ්‍ර කතුවරුන්ගේ අදහස් දැක්වීමේ අවස්ථා කිහිපයකදී පමණි. ජාත්‍යන්තර සම්මුතීන් යනු ජාත්‍යන්තර ගිවිසුමක් ලෙස ක්‍රියා කරන ජාතීන් දෙකක් හෝ කිහිපයක් අතර අත්සන් කරන ලද ගිවිසුම් වේ. ගිවිසුමක් යනු ජාත්‍යන්තර නීතිය සඳහා පදනම වන ජාතික රාජ්‍යයන් අතර බැඳීම් ගිවිසුමකි. මෙම ගිවිසුම් බලාත්මක කිරීම සඳහා අධිකාරිය සපයනු ලබන්නේ අත්සන් කරන පාර්ශ්වයන් ගිවිසුමට අනුකූල වීම මගිනි. නැතහොත් ගිවිසුම පිළිපැදීම මඟිනි (Myers, n.d.).

### 'ගිවිසුම' සහ 'ප්‍රකාශනය' අතර වෙනස හඳුනා ගැනීම

ප්‍රකාශනය යනු සාමාන්‍යයෙන් ජාත්‍යන්තර මූලධර්ම සකස් කරන බැඳීමක් නැති ලිඛිත උපකරණයකි. එය දේශපාලන හෝ සදාචාරාත්මක බලයක් විය හැකිය. ප්‍රකාශනයන් සාමාන්‍යයෙන් ජාත්‍යන්තර ආයතන සහ සම්මන්ත්‍රණ මගින් කෙටුම්පත් කර අනුමත කරනු ලැබේ. නමුත් ඒවා රාජ්‍යයන් විසින් අත්සන් කර අනුමත

නොකෙරේ. 'ගිවිසුම' යනු ලිඛිත ස්වරූපයෙන් රාජ්‍යයන් අතර අවසන් කර ඇති සහ එහි විශේෂිත තත්ත්වය කුමක් වුවත්, පොදු ජාත්‍යන්තර නීතිය මඟින් පාලනය වන නීත්‍යානුකූලව බැඳී ඇති ජාත්‍යන්තර ගිවිසුමකි. ගිවිසුම් ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික විය හැකිය (https://www.justice.gc.). ප්‍රකාශනය සෑම විට ම නීත්‍යානුකූලව බැඳී නැත. මෙම පදය බොහෝ විට හිතාමතාම තෝරා ගනු ලබන්නේ පාර්ශවයන් බැඳීම් ඇති කිරීමට අදහස් නොකරන නමුත් හුදෙක් යම් යම් අභිලාෂයන් ප්‍රකාශ කිරීමට අවශ්‍ය බව දැක්වීමට ය (*United Nations Treaty Collection*, 2009). ප්‍රකාශනය සුළු වැදගත්කමක් ඇති කාරණයක් සම්බන්ධයෙන් අවිධිමත් ගිවිසුමක් ද විය හැකිය. ඒකපාර්ශ්වික ප්‍රකාශ මාලාවක් හරහා බැඳීම් ගිවිසුම් පිහිටුවීමට ද හැකිය (*United Nations Treaty Collection*, 2009). ඒ අනුව බ්‍රිතාන්‍යයන් කරන ලද ඒකපාර්ශ්වීය ප්‍රකාශ මාලාව මඟින් පූර්ව පාඨයන් සැපයීමේදී ජොන් ඩේවි විසින් මෙම වචනය භාවිත කිරීම මෙම මතය අනුව ගොඩනැගෙන තර්කය හරහා තහවුරු වේ (Devy, 1821).

**'ගිවිසුම' සහ 'එකඟතාව' (Agreement) අතර වෙනස හඳුනා ගැනීම**

ගිවිසුම් නීතිය (Law of Treaties) පිළිබඳ 1969 වියානා සම්මුතිය "ජාත්‍යන්තර එකඟතා" (international agreement) යන යෙදුම එහි පුළුල් අර්ථයෙන් භාවිතා කරයි. එක් අතකින්, එය යම් යම් ලක්ෂණ සහිත "ජාත්‍යන්තර ගිවිසුම්" (international agreement) ලෙස ගිවිසුම් (treaties) නිර්වචනය කරයි. අනෙක් අතට, එය 'ගිවිසුම' (treaties) යන්නෙහි නිර්වචනය සපුරා නොමැති උපකරණ සඳහා "ජාත්‍යන්තර ගිවිසුම්" (international agreement) යන යෙදුම භාවිතා කරයි. 'එකඟතා' (Agreements) සාමාන්‍යයෙන් විධිමත් බවින් හීන වන අතර 'ගිවිසුම්' (Treaties) වලට වඩා පටු විෂය පථයක් සමඟ යෙදේ (United Nations, n.d.). සාමාන්‍ය 'එකඟතා' ආර්ථික, සංස්කෘතික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ කාරණා සම්බන්ධයෙන් යොදා ගැනෙයි. බොහෝ විට ද්විත්ව බදුකරණයෙන් වැළකීම, මූල්‍ය ආධාර දීම වැනි මූල්‍ය කරුණු සම්බන්ධයෙන් එය භාවිත වේ. ගිවිසුමක ඇතුළත් වන සංරචක (Components) එකඟතා (agreement) ලෙස හැඳින් වේ. එනම්, කොන්දේසි ය.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

1800 දී ෆෙඩ්රික් නොර්ත් ආණ්ඩුකාරයා මහනුවර රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ සමඟ ගිවිසුමකට එළඹීමට උත්සාහ කළේය. එහෙත් එය අසාර්ථක විය. ඉන් පසු 1815 ගිවිසුම නමින් ප්‍රසිද්ධ ලියවිල්ල සකස් වන තෙක් ලංකාවේ පාලකයා සහ බ්‍රිතාන්‍යයන් අතර ගිවිසුමක් අත්සන් නොවිණි. දිවුරා සපථ කරන ලද ගිවිසුමක් රහිතව පැමිණෙන සාම යෝජනා හඟවන්නේ කුමන්ත්‍රණයක් (උපක්‍රමයක්) (Plot) වශයෙන් බව චීන යුද දාර්ශනික සන්ට්සු පෙන්වා දෙයි (Tzu, 1910). 1815 දී ලංකාවේ සිදු වූයේ ද සාම යෝජනා ලෙසින් සකස් වූ කුමන්ත්‍රණ ලියවිල්ලක් බවට ද ප්‍රශ්නාර්ථයක් සකසා ගත හැකිය. 1800 දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමඟ ගිවිසුම්ගත වීමට නොහැකි වූ නිසා ඔහු බලයෙන් පහ කර දමා උඩරට රදල ප්‍රධානීන් සමඟ එකඟතාවකට පැමිණීමේ 1815 සිදුවීම කුමන්ත්‍රණයක් ලෙසින් ද සැලකිය හැකි ඓතිහාසික සන්දර්භයකි. මහනුවර පැවති ස්වෛරී, දේශීය පාලනය වෙනස් කිරීමට 1803 දී බ්‍රිතාන්‍යයන් උත්සාහ දැරූ අවස්ථාවේ කන්ද උඩරුටියන් බ්‍රිතාන්‍යයන්ට සහයෝගය නොදුණි. ඒ අවස්ථාවේ ලාංකිකයන්ගේ ප්‍රතිචාරයත්, මහනුවර රාජ්‍ය මහා බ්‍රිතාන්‍යයේ රජු අතට පත්කිරීමේ කාර්ය බ්‍රිතාන්‍යයන් විසින් සාර්ථක කර ගත් අවස්ථාවේ කන්ද උඩරුටියන් ඒ කෙරෙහි දක්වූ ප්‍රතිචාරත්, අතර පැහැදිලි වෙනසක් දක්නට ලැබේ. 1815 එකඟතා ප්‍රකාශයෙන් පසු බ්‍රිතාන්‍යයන්ගේ බලාධිපත්‍ය පිළිගැනීමට භික්ෂූන්, රදලයන් මෙන් ම පොදු ජනතාව ද යොමු විය. එසේ යොමු වුයේ පනතේ ඇති වගන්ති ඉටු වේ යැයි බලපොරොත්තුවෙනි. එහෙත් දීර්ඝ කාලීනව එය සිදු නොවුණි.

උඩරට සම්මුතිය, 1815 දී එක්සත් රාජධානිය සහ ලංකාවේ (ශ්‍රී ලංකාව) මහනුවර රාජධානියේ ප්‍රධානීන් අතර ඇති වූ එකඟතාවක් බව විශ්වකෝෂයේ දැක්වේ (Kandyan Convention, agreement in 1815 between the United Kingdom and the chiefs of the kingdom of Kandy in Ceylon (Sri Lanka) - *Kandyan Convention | British Rule, Ceylon, Colonialism | Britannica*, n.d.-b). සම්මුතියේ නියමයන් යටතේ ලංකාව, බ්‍රිතාන්‍යය කිරීටයේ සම්පූර්ණ පාලනයට ලබා දෙමින්, ලංකාවේ බ්‍රිතාන්‍යයන්ගේ භූමි සීමාවන්ට අයත් නොවූ සෙසු භූමි කොටස්වලට ඈඳා ගත්තේය. ඊට අමතරව මහනුවර රජු නෙරපා හැර ඔහුගේ පරමාධිපත්‍යය බ්‍රිතාන්‍ය කිරීටය වෙත පැවරිණි. එවකට පීඩාකාරී රජුට එරෙහිව බ්‍රිතාන්‍ය මැදිහත්වීමට ආරාධනා කළේ ඇතැම් උඩරට ප්‍රධානීන්ම ය. එබැවින් සම්මුතිය ඔවුන්ගේ සම්ප්‍රදායික අයිතිවාසිකම් සහ බලතල බොහොමයක් තහවුරු කළේය. මීට අමතරව, උඩරට සම්ප්‍රදායික නීති, සිරිත් විරිත් සහ ආයතන සාමාන්‍ය ස්වදේශික බලධාරීන් විසින් නඩත්තු කළ යුතු බවත් පරිපාලනය කළ යුතු බවත් සම්මුතියේ සඳහන් විය. එහෙත් මෙම 1815 ලියවිල්ලේ එකඟතාවන් ඉටු නොවීම මත ඇති වූ කනස්සල්ල මත 1817-18 බ්‍රිතාන්‍ය අණ්ඩු විරෝධී සටනක් ඇති විය. 1818

වන විට කැරැල්ල මැඩපැවත් වූ බ්‍රිතාන්‍යයෝ උඩරට ලියවිල්ල මඟින් පෙන්වා දී තිබූ බොහෝ අයිතිවාසිකම් 1818 ප්‍රකාශ පත්‍රය මඟින් උදුරා ගත්තේය (*Kandyan Convention | British Rule, Ceylon, Colonialism | Britannica*, n.d.).

**1815 ලියවිල්ල නාමකරණය පිළිබඳ විද්වත් අදහස්**

ක්‍රිස්තු වර්ෂයෙන් 1815 දී ද සිංහල වර්ෂයෙන් 1736 දී ද මාර්තු 2 වන දින මෙම සමුළුව පැවැත්විණි. මෙමඟින් වසර 2300 පමණ පැවති සිංහලේ රාජවංස ක්‍රමය අවසන් වූ අතර උඩරට ප්‍රධානීන් හරහා උඩරට පරිපාලන ක්‍රමය බ්‍රිතාන්‍ය පදිංචිකරුවන්ගේ අධීක්ෂණය යටතේ රදවා තබා ගැණුනි. 1815 මෙම සමුළුව එකතුව සැබවින් ම උඩරට ආක්‍රමණය සාර්ථක වීමෙන් පසු ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය යටතට පත් වූ බව තහවුරු කිරීමේ අරමුණින් ප්‍රධාන විධිමත් රැස්වීමක් කැදවීම යෝග්‍යය යැයි රොබට් බ්‍රවුන්රිග් සැලකීම මත ඒ සඳහා කරන ලද කැදවීමක් ලෙස සැලකිය හැකිය. එහෙත් මේ සම්බන්ධයෙන් වන ඉදිරි ක්‍රියාවලීන් සඳහා රදළවරු සමඟ සාකච්ඡා කළේ ඩොයිලි ය. මේ රැස්වීමෙන් පසු නිරවුල් කිරීම පිළිබඳ නිල 'ප්‍රකාශ පත්‍රය' ප්‍රකාශයට පත් විය. මෙය ප්‍රධානීන්ගේ ආරාධනයෙන් ආරම්භ වී ජනතාවගේ ප්‍රසංසාවෙන් පිළිගත් බ්‍රිතානයන්ගේ මහනුවර ආක්‍රමණයක් වූ බව 1815 මාර්තු 06 ලංකා රජයේ ගැසට් පත්‍රයේ සඳහන පදනම් කරගනිමින් කොල්වින් ආර් ද සිල්වා අදහස් කරයි[3] (C.G.G., 6th March, 1815 ; Silva, 1953) ලංකා රජයේ ගැසට් පත්‍රයේ සඳහන් වචනයත් කෝල්වින් ආර් ද සිල්වා තම ග්‍රන්ථයේ මේ සම්බන්ධයෙන් සටහන් කිරීමේදී භාවිත කර ඇති වචනයත් ''ප්‍රකාශ පත්‍රය'' (Proclamation) යන්නයි. ප්‍රාථමික මූලාශ්‍ර බෙහෝමයක දක්නට ලැබෙන වචනය වන්නේ මේ ප්‍රකාශ පත්‍රය, දැන්වීම පත්‍රය යන අර්ථය දනවන 'Proclamation' යන්න වුව ද ලංකාවේ බොහෝ ද්විතීයක මූලාශ්‍රයවල සම්මුතිය 'Convention' යන වචනය භාවිත වී ඇත. ආණ්ඩුකරු විසින් සකස් කරන ලද මෙම ලේඛනය රැස්ව සිටි රදළයන්ට (Chiefs) සහ පිටත රැස්ව සිටි ප්‍රධානීන්ට (Headmen) සහ ප්‍රධානීන්ගේ අනුගාමික ජනයාට කියවන ලදී (Marshall, 1846 ; Silva, 1953). ආණ්ඩුවේ නියෝජ්‍ය ලේකම් වූ සදර්ලන්ඩ් (Mr. Sutherland, deputy secretary to Government) විසින් ඉංග්‍රීසි භාෂවෙන් පළමුව ප්‍රකාශ පත්‍රය කියවූ අතර පසුව උතුමානන්ගේ මුදලි වූ ඒබ්‍රහම් ද සේරම් (Modeliar of His Excellence's gate Abraham De Saram) විසින් සිංහල භාෂාවෙන් මෙම ප්‍රකාශ පත්‍රය කියවන ලදී (Powell, 1984). පසුව රාජකීය ධජය ඔසවා රාජකීය ආචාර වෙඩිමුර පැවැත් විය. එහෙත් ජොන් ඩොයිලි සඳහන් කරන්නේ භාෂා දෙකෙන් ම මෙම ප්‍රකාශ පත්‍රය කියවූයේ ඒබ්‍රහම් ද සේරම් විසින් බවයි (D'Oyly, 1917). බ්‍රිතාන්‍ය යුගය පිළිබඳ පූර්ව පර්යේෂකයා වූ තෙන්නකෝන් විමලානන්දගේ උඩරට කැරැල්ල නම් ග්‍රන්ථයේ 1815 දැන්වීම් පත්‍රයේ මුල් පිටපතෙහි ඡායාරූපයක් දක්වා තිබේ. එහි සඳහන් පරිදි ඉංග්‍රීසි පිටපතේ ඉංග්‍රීසි භාෂාවෙන් 'Proclamation' නමින් හඳුන්වා ඇති පදයට දී ඇති සිංහලාර්ථය වන්නේ 'දැන්වීම් පත්‍රය' යන්නයි (උඩරට මහ කැරැල්ල, 2010). එහෙත් ඔහු මෙම ලියවිල්ල පිළිබඳ හඳුන්වා දීමේදී 'ගිවිසුම' යන වදන භාවිත කරයි. 1815 ලියවිල්ලේ අඩංගු එකඟතාවන් සැලකිල්ලට ගෙන විමලානන්ද විසින් මෙය 'ගිවිසුම' නමින් නම් කරා විය යුතුය. සමුළුවක් පැවැත් වූ බවට මෙම ලියවිල්ලේ වන සඳහන සම්මුතියක් ඇති කර ගත් බවට වන සඳහනක් ලෙස සැලකීම විශේෂතාවකි. එකඟව (පහත සඳහන් ආකාරයෙන්) ස්ථාපිත කර ගත් බව මෙම ''දැන්වීම් පත්‍රය'' නැතහොත් ''ප්‍රකාශ පත්‍රයේ'' සඳහන් වේ. 1815 ලියවිල්ල සම්බන්ධයෙන් පොල් ඊ පීරිස් දක්වන්නේ මාර්තු 2 දා සවස 4ට මහනුවර මංගල්‍ය මණ්ඩපයේ සම්මේලනයක් පැවැති වූ බවයි

> ...At 4 p.m. on the 2nd day of March a convention met within the precincts of Vásala in the Manglya Mandapē,...Pieris, 1995

එහෙත් ඔහු තවත් තැනක මෙය ගිවිසුමක් බව දක්වයි. 1815 ලියවිල්ල ගිවිසුමක් බවත් මාර්තු 2 වන දින මහනුවරදී පැවැත්වුණු මහ සභාවේදී කියවා සම්මත කරගත් පාලනය නිරවුල් කරගැනීම පිළිබඳ පනතක් බවත්, මෙහි වගන්තිවලට අනුව සිංහලයන් සතු දේශපාලන නිදහස ඇති අන්තිම භූමි ප්‍රදේශයෙහි ශ්‍රේෂ්ඨතම අයිතිවාසිකම්, මහජනයා වෙනුවෙන් පෙනී සිටි බව කියා පෑ අදිකාරම්, දිසාපති, මොහොට්ටාල ආදී අධිපතීන් විසින් නැවත වෙනස් කළ නොහැකි සේ ඉංග්‍රීසීන්ට පවරා දෙන ලද බවත් එස්. ජී. පෙරේරා පියතුමා දක්වයි (පෙරේරා, 1960). මෙම ලියවිල්ල සම්මුතියක් බව ඇතැම්හු අදහස් කරති (Strathern, 2017).

1815 ලියවිල්ල බ්‍රිතාන්‍ය රජය සහ උඩරට ප්‍රධානීන් අතර ඇති කර ගත් සම්මුතියක් 'Convention' මිස වැඩි දෙයක් නොවන බව පෙනී යන්නේ යැයි කොල්වින් ආර් ද සිල්වා අදහස් කරයි (Silva, 1953). ආර් ද සිල්වා

[3] "After this assembly, an official declaration of the annexation was proclaimed"

වැඩි වශයෙන් සිය පර්යේෂණ ග්‍රන්ථය තුළ භාවිත කර ඇත්තේ 'Convention' (Silva, 1953) යන වචනය වන අතර 'Proclamation' යන වචනය සුළු වශයෙන් ද 'ගිවිසුම' (Treaty) යන වචනය ඉතා විරල වශයෙන් භාවිත කර ඇත (Silva, 1953). ආර් ද සිල්වාගේ අදහස අනුව මෙය ගිවිසුමකට වඩා තම බලය ප්‍රචලිත කිරීමේ උපක්‍රමයක් බව පෙනේ. ඔහු සඳහන් කරන්නේ බ්‍රිතාන්‍යයන්ගේ මේ ප්‍රකාශ තමන් වෙත ආරෝපණය කරගන්නා ලද ධාර්මිකත්වයකින් සහ අහංකාර පර්වශ භාවයකින් යුත් අලංකාර ප්‍රකාශ වුවත්, ඒවා ශූර ප්‍රචාරණ උපක්‍රම වූ බවයි (Silva, 1953). 1815 ගිවිසුම වනාහි උඩරට කිරීටය බ්‍රිතාන්‍ය රජ පෙළපතට පවරා දීම සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුව හා උඩරට අධිකාරම්වරු අතර ඇති වූ හුදු ගිවිසුමක් පමණක් බවත් කොල්වින් ආර් ද සිල්වා වැඩිදුරටත් සඳහන් කරයි (සිල්වා, 1958. පි. 175-177). ජී.සී. මැන්දිස් සඳහන් කරන්නේ මහනුවර අත්පත් කරගැනීමෙන් පසු බ්‍රිතාන්‍යයෝ රදලවරු සමඟ ගිවිසුමකට බැඳුණ බවයි (මැන්දිස්, 1963, පි. 27). උඩරට සම්මුතියෙන් පිළිබිඹු වූයේ එකල ක්‍රියාත්මක වූ දේශපාලන සාධකයන් බවත්, එම අවස්ථාවේ උඩරට අවශ්‍යතා සඳහා ලබා දුන් සහන ලබා දුන්නේ ඉංග්‍රීසීන්ට අගනා ආධාර කළ කණ්ඩායම්වල විරුද්ධත්වය නැති කර ගැනීමේ (මිත්‍රත්වය ඇති කර ගැනීමේ) අරමුණින් මේවා අත්‍යාවශ්‍ය යැයි දේශපාලන තත්ත්වය යෝජනා කළ බැවින් බවත් කේ.එම්.ද සිල්වාගේ අදහසයි (Silva, 2014). 1815 සම්මුතියේ නියමයන් බොහෝ දුරට කෙටුම්පත් කර ඇත්තේ ජෝන් ඩොයිලි විසින් බවත් කේ.එම්.ද සිල්වාගේ දක්වයි. වගන්ති දොළහකින් යුතු මෙම ලියවිල්ල බ්‍රිතාන්‍ය රාජ්‍යතාන්ත්‍රික කපටිකම් ලොවට හඬගා කියන තවත් අවස්ථාවක් පමණක් බව එම්. යූ. ද. සිල්වාගේ පෙන්වා දෙයි (සිල්වා, එම්.යූ., 1996). උඩරට ගිවිසුම ජාත්‍යන්තර සම්බන්ධ ප්‍රශ්නයක් මතු කිරීමට සමත් වූවක් නොවන බව තවත් විද්වත්හු සලකති (ටිකිරි අබයසිංහ, ශ්‍රීමතී දේවරාජ, පී.වී.ජී. සෝමරත්න, 1977). බී. එච්. ෆාමර් සඳහන් කරන්නේ 1815 මාර්තු 2වන දින බ්‍රිතාන්‍යයන් හා මහනුවර අතර සාකච්ඡාවක් (Convention) පැවති බවයි (Famer, 1963).

උඩරට අත්පත් කර ගත් පසු ඉංග්‍රීසි ආණ්ඩුකරු රජු සතුව පැවති ප්‍රධාන බලතල තමන් සතු කර ගත්තේය. ඒ අනුව දේශපාලන, විධායක හා අධිකරණ බලතල ඔහු සතු විය (කුලසේකර, 2019). ආණ්ඩුකරු උපදේශකයන් ලෙස රදළ ප්‍රධානීන් ගණනාවක් සම්බන්ධ කර ගත්ත ද එවැන්නක් කළේ සාම්ප්‍රදායික නීති හා සිරිත් විරිත් පිළිබඳ උපදේශකයන් ලෙස පමණි (Governor's Speech of on 20 May 1816). 1815 ගිවිසුමකින් සම්මත වූයේ නම් අසමාන බලය බෙදීමක් නොව සමාන බලතල හා අයිතිවාසිකම් හිමි වීමට අවස්ථාව ලැබේ. එහෙත් එවැන්නට බ්‍රිතාන්‍ය පාලකයන් නොපෙළඹී ඇති අතර ලාංකිකයන් තම පාලනයට සම්බන්ධ කර ගත්තේ තම දේශපාලන බලාධිපත්‍ය තහවුරු කර ගැනීමේ අවශ්‍යතාව මත පමණක් බව මින් ගම්‍ය වේ. රදළ ප්‍රධානීන්ගේ බලය හා අධිකාරී බලය දුර්වල වූ බව ඌව වෙල්ලස්සේ සංචාරය කළ මේජර් හාඩිගේ වාර්තාව පදනම් කරගෙන කුලසේකර පෙන්වා දෙයි (Hardy to Browrigg, 10 June 1815, CO 54/56; කුලසේකර, 2019). ඒ අනුව සමාන බල බෙදීමක් නොවූ බව පැහැදිලි ය. එසේම මෙම 1815 ලියවිල්ලෙන් පසු ඩොයිලි විසින් ප්‍රභූන්ට දෙන නියෝගයක් වන්නේ 1815 වර්ෂය තුළ තමන් කළ පත්වීම් හා සම්ප්‍රදායට අනුව ඔවුන්ට ලැබූ මුදල් ත්‍යාග පිළිබඳ තොරතුරු වාර්තා කළ යුතු බවයි (D'Oyly to Brownrigg, 2 June 1815, CO 54/56; කුලසේකර, 2019). ගිවිසුමක් වූයේ නම් මෙවැනි බලහත්කාර නියෝග පැනවීමේ අවස්ථාවක් ඇති කර ගැනීම බ්‍රිතාන්‍ය පාලකයන්ට අසීරු වනු ඇත.

1815 ගිවිසුමක් යැයි වැඩි වශයෙන් ඉතිහාසඥයන් හා සිංහල ජන සමාජය අතර ප්‍රචලිත වීමට කරුණ වූයේ මෙම 1815 ලියවිල්ලේ 5 වන වගන්තියේ සඳහන් බුද්ධාගම හා දේවාගම ආරක්ෂා කරන බවට බ්‍රිතාන්‍ය පාලකයන් පොරොන්දු වූවා යැයි කියන කරුණ ය. එහෙත් සැබවින් ම මෙමඟින් උඩරට සම්මුතිය මගින් බ්‍රිතාන්‍යයන්ට බුදුදහමේ ඒත්තු ගැන්වෙන අනුග්‍රාහකයන් වීමට ඉඩ ලබා දුන්නේය (Robert Brownrigg to Earl Bathurst, 8 January 1819 (CO 54/73, no. 317), in Vimalananda, Great Rebellion). සිංහල සමාජය 5 වන වගන්තිය බ්‍රිතාන්‍යයන් ලාංකිකයන්ට ලබා දුන් පොරොන්දුවක් යැයි සැලකුව ද එය බ්‍රිතාන්‍ය පාලකයන් පාර්ශ්වයෙන් සැලකීමේදී දේශපාලන ආධිපත්‍ය තහවුරු කර ගැනීම සඳහා ඇතුළත් කළ උපක්‍රමික වාක්‍ය කණ්ඩයක් පමණි. බුදුදහම මිත්‍යාදෘෂ්ටික ආගමක් ලෙස සැලකූ බවුන්රිග් එම වගන්තිය ඇතුළත් කළේ ආධිපත්‍ය තහවුරු කරගැනීමේ අරමුණින් සහ 'නව ආගන්තුක ජනතාවක් සමඟ දේශපාලන දීගය' පහසු කරගැනීමේ අරමුණිනි (Brownrigg to Bathurst, 15 March 1815, CO 54/55; Brownrigg to Wilberforce, 13 June 1816, CO 54/60; කුලසේකර, 2019). තවද බුදුදහම ආරක්ෂා කිරීම 'අනුලංගනී' වූවක් යැයි මේ ලියවිල්ල ඇසුරින් ලාංකිකයෝ සැලකුව ද 'බුදුදහමට අවහිර නොකිරීමක්' විනා ඊට වැඩි යමක් ඉන් අදහස් නොකළ බවට බ්‍රවුන්රිග්ගේ අදහස වූ බව ප්‍රාථමික මූලාශ්‍රය පදනම් කර ගත් පසුකාලීන ලාංකික පර්යේෂකයන්ගේ ද මතයයි (Brownrigg to Bathurst, 1 June 1816, CO 54/60 ; කුලසේකර, 2019).

සැබවින්ම ලාංකිකයන්ගේ පාර්ශ්වයෙන් 1815 ලියවිල්ල ගිවිසුමක් යැයි ව්‍යවහාරයට පැමිණිය ද බ්‍රිතාන්‍ය පාලකයන්ට එය ගිවිසුමක් නොවුණි. බලය ලබා ගැනීමෙන් පසු බ්‍රිතාන්‍යයන් සිදු කළේ තමන්ට වඩාත් වාසි සහගත වන පරිද්දෙන් පාලනය සිදු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමයි. එහිදී ලාංකිකයන්ගේ අභිලාෂයන් පිළිබඳ තැකීමක් කිරීමට බ්‍රිතාන්‍ය පාලකයන්ට අවශ්‍යතාවක් නොතිබිණි. 1815 සිදු වූ ප්‍රකාශය බලය ලබා ගන්නා අවස්ථාව පසු කරන තෙක් ලාංකික රදළයන් හා භික්ෂූන් සතුටු වන යමක් කරන බවට කළ හුදු මවාපෑමක් පමණි. එවැනි ගිවිසුමක් පිළිබඳ ස්ථාවරයක් බ්‍රිතාන්‍යයන් සතු වූයේ නම් ඔවුන් 1815 සිට වසර දෙකක් ගතවන විට කැරැල්ලක් උද්ගත වන තත්ත්වයක් නිර්මාණය කර ගනු වෙනුවට මහත්මා පාලනයක නියැලෙන්නට ඉඩ තිබුණි. ප්‍රභූන්ට තනතුරු දීමත් (Brownrigg to Bathurst, 15 March 1815, CO 54/55; කුලසේකර, 2019), සංඝ සංවිධානය තුළ ඉහළ ම තනතුරුවලට භික්ෂූන් පත් කිරීමත් සිදු කළ බ්‍රිතාන්‍යයෝ බුද්ධාගම හා පූජනීය ස්ථානවලට පූර්ණ ආරක්ෂාව සැලසීම ගිවිසුම නිසා සිදු වූවක් යැයි කල්පනා කළ නොහැකිය. එය ජනයාගේ අවනත බව සහ සංඝ සමාජයේ එකඟතාව ලබා ගෙන භික්ෂු සංඝයා මුලා කොට තබා ගැනීමට ගත් පියවරක් ලෙස ද සැලකිය හැකිය. භික්ෂූන් වහන්සේලා හා එවැනි රජයක් අතර කෙබඳු සම්බන්ධතාවක් වුව ද ස්වභාවික ම නොගැළපෙන බව කොල්වින් ආර් ද සිල්වා ද පෙන්වා දෙයි (De silwa, 1953). මහනුවර අල්ලා ගත් ආසන්නයේ ම එනම්, 1815 මාර්තු 02 දින බඹරදෙණියේ ලියනරාල හා උඩුනුවර...(නම සඳහන් කර නොමැත) දෙදෙනා පැමිණ ආගම ආරක්ෂා කරන ලෙස ඉල්ලීමක් කළ බව ජොන් ඩොයිලි තම දින පොතේ සටහන් කරයි (D'Oyly, 1917). මේ අනුව පැහැදිලි වන්නේ ආගම අනතුරට ලක් වීමට පැවති ඉඩ කඩ පිළිබඳ ලියවිල්ල සකස් කරන අවස්ථාව වන විට ම ලාංකිකයන්ට අවබෝධයක් පැවති බවයි. 1815 කන්ද උඩරට බ්‍රිතාන්‍යන් අල්ලා ගැනීමෙන් පසු කාලයේ බ්‍රිතාන්‍ය සෙබළු නීති විරෝධී ක්‍රියාකාරකම් හා කොල්ලකෑම්හි නිරත විය (D'Oyly, 1917). මේ ලියවිල්ල බ්‍රිතාන්‍ය පාලකයන් සකස් කර ඇත්තේ ලාංකිකයන්ගේ ඇතැම් අවිචාරක හැඟීම්වලට (බ්‍රිතාන්‍යයන්ගේ අදහසින්) පහර නොවදින සේ යැයි ද ලාංකිකයන් යුරෝපීය බලයකට යටත්වීමට නම් මේ කරුණු අතින් ඔවුන් සතුටු කිරීම අවශ්‍ය යැයි ද මෙකල ලියවිල්ල සකස් වූ සමයේ දූෂමාන අදහස් පැතිර පැවතිණි (Marshall, 1846).

**'ගිවිසුම' හෝ 'සම්මුතියක්' ලෙසින් 1815 ලියවිල්ලෙහි බලාත්මක භාවය පිළිබඳ ගැටලුව**

සිංහල භාෂාවෙන් 1815 ''දැන්වීම් පත්‍රය' නමින් ප්‍රසිද්ධියට පත් කර ඇති මුල් පිටපතේ මෙය ඉංග්‍රීසි භාෂාවෙන් 'Proclamation' නමින් දක්වා ඇත (විමලානන්ද, 2010 ; Devy, 1821; Skeen, 1853). සැබවින්ම 'සම්මුතිය' යන වචනයේ හා 'ගිවිසුම' යන වචනයෙහි අර්ථ නිරූපණයන් වෙනස් ය. ඒ අනුව ''දැන්වීම් පත්‍රය'', ''ප්‍රකාශ පත්‍රය'' හෝ සම්මුතිය ලෙස නොව 1815 ගිවිසුම ලෙසින් සිංහලයන්ගේ භාවිතයට හුරු වීම ඒ වදන සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලකින් තොරව පරම්පරානුයාතව කරන ලද භාවිතයක් බව පෙනේ.

ඉංග්‍රීසි භාෂාවේ වචනාර්ථ අනුව 1815 ලියවිල්ල සඳහා 'ප්‍රකාශ පත්‍රය' (Proclamation) හා 'ප්‍රකාශනය' (Declaration) යන වචන දෙක යෙදීම සලකා බැලුවහොත් මෙම ලියවිල්ල සඳහා භාවිතා කිරීමට වඩාත් යෝග්‍ය වචනය ලෙස බ්‍රිතාන්‍ය පාලකයන් තෝරා ගෙන ඇත්තේ 'ප්‍රකාශ පත්‍රය' යන්නයි. 1815 ලියවිල්ලේ සන්දර්භය සහ සිදු වූ ක්‍රියාවලිය සැලකීමේදී වඩාත් උචිත වචනය එය ලෙස සැලකෙන්නට ඇත. බ්‍රිතාන්‍යයන් තම වචන තෝරා ගැනීම එකී අවස්ථාවේ උද්ගතව පවතින සන්දර්භය සැලකිල්ලට ගෙන ඒ මත රඳා පැවති බවට ද මෙමඟින් අදහසක් ගම්‍ය කරයි. රජයක් හෝ වෙනත් නිල ආයතනයක් විසින් කරන ලද නිවේදනයක් ගැන සඳහන් කරන්නේ නම්, 'ප්‍රකාශ පත්‍රයක්' යන්න වඩාත් සුදුසු යෙදුම බැවින් එය මෙහිදී භාවිත කර ඇති බව පෙනේ. වඩාත් පොදු නිවේදනයක් හෝ ප්‍රකාශයක් වෙත යොමු කරන්නේ නම්, 'ප්‍රකාශනය' යන්න වඩා නිවැරදි තෝරා ගැනීම වන නිසා ජෝන් ඩේවි මෙම ප්‍රකාශය පිළිබඳ හැඳින්වීමේදී "Official Declaration" යන වචන දෙක භාවිත කර ඇත (Devy, 1821). එනම්, 'රාජ්‍ය ප්‍රකාශනයක්' නැතහොත් 'නිල ප්‍රකාශනයක්' ලෙස මෙය නිකුත් වූ බවයි.

1815 ලියවිල්ල ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා ප්‍රමුඛ බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් සකස් කරන ලද 'රාජාඥා පත්‍රයකි'. මෙම ලියවිල්ල සකස් කිරීමේ මූලිකයා වූ ජොන් ඩොයිලි සඳහන් කරන්නේ 1815 මාර්තු 2 වන දින පස්වරු 4.00ට මහනුවර මඟුල් මඩුවේ දී කන්ද උඩරට පළාත් පිළිබඳව සකස් කරන ලද ප්‍රකාශ පත්‍රය නැතහොත් නිරවුල් (බේරුම්) කිරීමේ පනතක් ලෙස මෙය ඉදිරිපත් කරන ලද බවයි.

> "At 4 PM. the Govn. gives Audience to the Adikars, Disaves, & other Kandyan Chifes-The Proclamation or Act of Settlement of the Govt. of the Kandyan Provinces is read in the Magul Maduwa..."(D'Oyly, 1917).

මෙය ඇසීමට පැමිණ සිටි මොහොට්ටාලවරුන් හා පහත් නිලධරයන් හැර අදිකාරම්වරු, දිසාවේවරු හා අනෙක් උඩරට ප්‍රභූන්ට එය කියවා රාජකීය ධජය ඔසවා රාජකීය ආචාරය පවත්වනු ලැබිණි (D'Oyly, 1917). මෙම ලියවිල්ල බ්‍රිතාන්‍ය රටේ අවශ්‍යතාව මත විදේශීය භූමියක් අත්පත් කර ගැනීම හා බැඳුණු ක්‍රියාවලියක් බව බ්‍රවුන්රිග් ආණ්ඩුකරු විසින් ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන්ට කරන ප්‍රකාශයකින් හෙළිදරව් වේ (Connected with the Acquisition of a foreign Territory. - Pieris, 1995). මේ ලියවිල්ල 'ප්‍රකාශ පත්‍රය' නමින් නම් කරන ජොන් ඩේවි සිංහලයන් හා බ්‍රිතාන්‍යයන් අතර ඇති කර ගත් සමුළුවකදී මේ සම්මුතිය ඇති කර ගත් බව පෙන්වා දෙයි (Davy, 1821).

1815 දී බ්‍රිතාන්‍යයන් ලියූ 'ප්‍රකාශ පත්‍රයේ' ආරම්භයේදී ම සඳහන් වන්නේ "At a convention held on 2nd day of March,..." යනුවෙනි (Davy, 1821; Skeen, 1853; Somasundaram, 2008). 'At a' යනුවෙන් වාක්‍ය ආරම්භ කිරීමෙන් 'කිසියම් ස්ථානයක්' නැතහොත් 'අවස්ථාවක්' අර්ථ ගැන්වීමත් held යන්නෙන් 'තිබුණු බවක්', 'පැවැත්වූ බවක්' අර්ථ ගැන්වීමත් අනුව 'සම්මුතිය' යන අරුතින් මෙය භාවිත වී නොමැති බවට වැඩි බරක් ලැබේ. ඒ අනුව මෙම වාක්‍ය කණ්ඩයේ සිංහල පරිවර්තනය 'මාර්තු 2වන දින පැවැත්වූ සමුළුවේදී...' යන්න ගත හැකිය. 'Convention' යනුවෙන් මෙම ප්‍රකාශයේ සඳහන් වන එකම අවස්ථාව ද මෙයයි. ඒ අනුව මේ 'ප්‍රකාශ පත්‍රයට' සම්මුති යන නම දී නොමැති බව පෙනේ. 1815 මහනුවර බ්‍රිතාන්‍ය ප්‍රධාන කාර්යාලයේ සිට ඩොයිලි වෙත රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකරු විසින් යවන ලිපියේ සඳහන් වන්නේ අද දින මහනුවර අලුතින් ලබා ගත් ප්‍රදේශ බ්‍රිතාන්‍ය රජතුමාට පැවරෙන සේ සමුළුවක් (Convention) ඇති කර ගන්නා ලද බවයි.

> The Convention held this Day having placed the Kandyan Provinces under His Majesty's Dom[inion] it remains to be t[he] Representative of the British Government in [the] newly acquired Territory (D'Oyly, 1917).

මෙම 'Convention' යන ඉංග්‍රීසි වචනය 'සම්මුතිය' යන අර්ථයෙන් ම නොව 'ගිවිසුම' නැතහොත් 'සම්මේලනය' නැතහොත් 'සංගමය' නැතහොත් 'සම්මතය' නැතහොත් 'නියෝජිතයන්ගේ රැස්වීම' නැතහොත් 'චාරිත්‍රය' නැතහොත් 'චාරිත්‍ර විධිය' නැතහොත් 'සම්ප්‍රදාය' යන සිංහල අර්ථයන්ගෙන් ද යොදා ගත හැකිය. මෙම අවස්ථාවේදී ද ආණ්ඩුකරු මෙම වචනය යොදා ඇති ආකාරයට එයින් 'සම්මුති' යන්න ම අදහස් කළ යැයි උපකල්පනය කළ නොහැකිය. එය තහවුරු කළ හැක්කේ 'Convention' යන වචනය යෙදීමෙන් පසු 'held' යන යෙදීමෙන් 'යම් ක්‍රියාකාරකමක් සඳහා එක්රැස්වී, ඉදිරියට ගෙන යාම' (to assemble for and carry on the activity of - *Definition of HOLD*, n.d.) යන නිර්වචනය එමඟින් ඉස්මතු වීමත්, 'Convention' යන ඉංග්‍රීසි වචනයට යථෝක්ත සියලු සිංහල අර්ථයන් භාවිත කළ හැකි වීමත් පදනම් කරගෙන ය. 'Convention' යන වචනය මෙම වාක්‍යයේ යෙදී ඇති ආකාරය අනුව 'සම්මුතිය' යන නිශ්චිත සිංහල අර්ථය ඊට ලබා දිය නොහැකිය. එමෙන් ම, ඩොයිලි සිය දින පොතෙහි සටහන් තබා ඇති දින සියල්ලෙහි ම මෙම වචනය භාවිත වී ඇත්තේ එක වරක් පමණක් වීම ද විශේෂිත වේ. එසේම මෙම ලිපියේ ම ආණ්ඩුකරු සඳහන් කරන්නේ මෙදින සිදු වූ ප්‍රකාශ පත්‍රය (Proclamation) යටතේ ඩොයිලිව උඩරට පළාත්වල පිළිගත් නියෝජිතයා ලෙස පත් කරන බවයි.

> ...you will receive a Warra[nt or Com-] mission of appointment constituting you Accredited Agent of the British Government in the Kandyan Provinces under the proclamation of this date... (D'Oyly, 1917).

එසේම 'ප්‍රකාශ පත්‍රය' යන වචනය සමඟ ඩොයිලි භාවිත කර ඇත්තේ "Subscribes Proclamation" යන්නයි (D'Oyly, 1917). එනම්, අනුමැතිය හා පිළිගැනීම ලබා දෙමින් 'ප්‍රකාශ පත්‍රයට' අත්සන් කිරීම අරුත් ගැන්වීම මෙමඟින් අදහස් කරයි (*Definition of SUBSCRIBE*, 2023).

මෙම ලියවිල්ල සම්මුතියක් හෝ ගිවිසුමක් නොව (it's not a convention or treaty) කන්ද උඩරට පළාත් පිළිබඳව සකස් කරන ලද 'ප්‍රකාශ පත්‍රයක්' (Proclamation) බවට ද (This was a proclamation - Davy, 1821 ; Vimalananda, 1973), නිරවුල් කිරීමේ පනතක් බවට ද, ප්‍රාථමික මූලාශ්‍රයවල හඳුන්වා දී තිබේ. 1815 ලියවිල්ලේ මුල් විස්තරයේ බ්‍රිතාන්‍යයන්ගේ 'ජනාවාස සහ ප්‍රදේශ' (...over the British Settlements and Territories in the Island of Ceylon,...) යන වචන ද්විත්වය පිළිබඳව ද සඳහනක් වේ (Davy, 1821). මෙය 1815 ලියවිල්ල 'ප්‍රකාශ

පත්‍රයක්' නැතහොත් නිරවුල් කිරීමේ පනතක් බව තහවුරු කිරීමට පවතින තවත් සාධකයකි. ගිවිසුමක නියෝග කිරීමකට අවස්ථාවක් නොමැත. ගිවිසුමක මූලික වන්නේ ගිවිසුමේ පාර්ශවයන් පොදු එකඟතාවකට පැමිණීමයි. නියෝග ලබා දීම සිදු වන්නේ පාර්ශවයක් තවත් පාර්ශවයකට වඩා බලයෙන් හීන මට්ටමක සිටියදී ය. ඒ අනුව ලංකා පාර්ශවය බ්‍රිතාන්‍ය පාර්ශවයට වඩා බලයෙන් හීන වී සිටි බවත් ලාංකිකයන් වෙත නියෝගයක් ලෙසින් මේ 'ප්‍රකාශ පත්‍රය' එළිදක්වා ඇති බවත් අදහස් කළ හැකිය. 1815 දී එවැනි එකඟතාවයකට එළඹීමකට වඩා බ්‍රිතාන්‍යයන් විසින් සකස් කරන ලද ලියවිල්ලක් ලාංකික රදළවරු පිරිසක්, භික්ෂු පිරිසක් ඉදිරියේ භාෂාද්වයෙන් ප්‍රකාශ කිරීම පමණක් සිදු වූ බවට අදහස් කළ හැකිය. මේ ක්‍රියාදාමයන්හි  සාක්ෂිකරුවෙකු වන එල්.ඩී. බුෂේ මෙය ''එකගතා ප්‍රකාශයක්'' නමින් ද තවත් තැනක 'සම්මුතිය' (Convention) නමින් හඳුන්වමින් සඳහන් කරන්නේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට දඬුවම් කළේ බ්‍රිතාන්‍යයන් ප්‍රතිරාජයෙකු නොව ඔහුගේ යටත්වැසියන් සහ ඔහුගේ ම රාජාණ්ඩුවේ ක්‍රියාවන් විසින් බවයි (Bushe, 2013). බුෂේ විසින් 1815 'ප්‍රකාශ පත්‍රයක්' ලෙස නාමකරණය කර දක්වා ඇත (Bushe, 2013). ජොන් ඩේවි විසින් පෙන්වා දෙන්නේ 1815දී සිදු වූයේ උඩරට පළාත් සමතයකට පත් කිරීමේ 'නිල ප්‍රකාශනයක්' නිකුත් කිරීම බවයි (Official Declaration of the Settlement of the Kandyan Provinces - Davy, 1821). 1815 ලියවිල්ල හා බැඳුණු සිදුවීම් සම්බන්ධයෙන් ජෝන් ඩේවිට ලද වාර්තාවක් අනුව ඔහු දක්වන්නේ ලාංකිකයන් යුරෝපා ජාතියකට ස්වෙච්ඡාවෙන් යටත් වූ බවයි (Voluntary submission to an European power  - Davy, 1821). ස්වභාවයෙන් ම යටත් වූ ජාතියක් වෙත බ්‍රිතාන්‍යයන් තම බලය භාවිත කර මෙම ප්‍රකාශ පත්‍රය සකස් කළා යැයි සැලකීම යුක්තියුක්ත වන නමුත් බ්‍රිතාන්‍යයන් හා සමාන බලයක් සහ වගකීම් සහිත ගිවිසුමකට එළඹුනේ යැයි අදහස් කළ නොහැකිය. යටත් කරන ලද ජාතියක් සමඟ ගිවිසුමකට එළඹීමේ අදහසක් බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීන් සතු වී යැයි සැලකිය නොහැකිය. ගිවිසුමේ අන්තර්ගතය විශ්ලේෂණය කිරීමේදී එවැන්නක් තහවුරු නොවේ. මේ අනුව මෙය ලාංකිකයන්ට අසා සිටීමට සකස් කළ 'ප්‍රකාශ පත්‍රයක්' බව අදහස් කළ හැකිය. ප්‍රකාශ පත්‍රය යන වචනාර්ථයෙන් ම මෙය ගිවිසුමක් නොවන බව ගම්‍ය වේ. ගිවිසුමකට එළඹීමට තරම් වූ අවබෝධයක් එකල ලාංකික ප්‍රභූන්ට හා භික්ෂූන්ට පැවතියේ නම් 1815 දී මෙම ලේඛනය සකස් කරන කාලයේ සහ සම්මත කරන අවස්ථාවේ එය ඊට වඩා බලවත් ආකාරයෙන් සකස් කරගැනීමට හෝ ගිවිසුමකට නොගැලපෙන ආකාරයේ වගන්ති පවතින්නේය යන පදනම මත විරෝධතා දැක්වීමට අවස්ථාවක් රදළවරුන්ට හිමි වේ. එහෙත් එවැනි විරෝධතාවක් ලාංකිකයෝ සිදු කළ බවට සාධක නොමැති අතර වාර්තා වන්නේ 1815 මාර්තු 2 දා මෙම ලියවිල්ල අත්සන් කරන ලද බව පමණි. එහෙත් මේ ලියවිල්ලට මාර්තු 10 දා ද ලාංකික පාර්ශවයේ ඇතැම් ප්‍රභූහු අත්සන් තැබූහ.

ඉන්දියාවේදී ජයග්‍රහකයන්ට පැවරේ යැයි සැලකෙන සීමා රහිත බලය ලංකාවේදී ඉංග්‍රීසීන් තමන් වෙත ආරෝපණය කර ගැනීම උඩරට ප්‍රධානීන් තුෂ්නිම්භූතව අනුමත කළ බව හෙන්රි මාෂල්ගේ අදහසයි (Marshall, 1846). බ්‍රිතාන්‍යයන් මෙම යටත්විජිත සමයේ සෙසු යටත්විජිතයන් සමඟ එළඹි ගිවිසුම නමින් හඳුන්වන ලද ලියවිලිවල ලක්ෂණයන් සහ ලංකාවේ ගිවිසුම නමින් ප්‍රචලිත ලියවිල්ලෙහි ලක්ෂණයන් වෙනස් ය. විශේෂත්වය නම් මේ සෑම ගිවිසුමක් ම අත්සන් කිරීමේදී බ්‍රිතාන්‍යයන් සමඟ ගිවිසුම්වලට එළඹ ඇත්තේ ඉන්දියාවේ පිළිගත් බලය ලත් පුද්ගලයන් විමයි. එනම්, බ්‍රිතාන්‍ය පාලකයන් ගිවිසුම්ගත වූයේ එම යටත්විජිතයේ ඒ වන විට සිටි පාලකයා සමඟ ය. 1815 දී සිදු වූයේ නිසි ජනතා බලයකින් හෝ රාජ උරුමයකින් රාජ්‍යත්වයට පැමිණි රජෙකු නොමැති, ජනතාව විසින් මුළුමනින් ම නොළිගත් රදල පිරිසක් සමඟ වූ සාකච්ඡාවකින් පසු එළඹි එකඟතාවකි. මෙම නාමමාත්‍රික ගිවිසුමට අඳාළ එක් පාර්ශවයක් (රදලවරු) එක දිනයක මෙම ලියවිල්ලට අත්සන් තබා නොමැත. ඇහැලේපොල සහ නුවරකලාවියේ ගලගොඩ දිසාව විසින් මෙම ලියවිල්ලෙහි අත්සන් තබා ඇත්තේ 1815 මාර්තු 18 වැනි දින ය (D'Oyly, 1917). 1815 මාර්තු 2 වන දින මෙය ගිවිසුමක් ලෙස දෙපාර්ශවයක් විසින් අත්සන් තැබුවේ නම් ගිවිසුමේ එක් පාර්ශවයක් 1815 මාර්තු 2වන දින, 10 දින සහ 18 වන දින ලෙස විටින් විට අත්සන් යෙදීමට බ්‍රිතාන්‍යයන් කටයුතු සැලසුම් කළේත්, ඊට අවස්ථාව ලබා දුන්නේත් මන්ද යන්න ගැටලුකි (D'Oyly, 1917). එසේම ඇහැලේපොල මහනුවර මඟුල් මඩුවේ වූ මෙම සමුළුවට සහභාගි නමුත් සක්‍රීයව සාකච්ඡාවට සම්බන්ධ නොවීමත්, රාජසිංහ රජුගේ සමීපතමයෙකු වූ ගොඩපොල දිසාවේ වූ මිල්ලෑවේ ඉතා නිහඬව සිටිමින් අවශ්‍ය අවස්ථාවල පමණක් මහඅධිකාරම්ට කරුණු දැක්වීමත් (Devy, 1821), මඟුල් මඩුවට ඇතුළු වූ ලාංකික ප්‍රභූන්ගෙන් ප්‍රථමයා වුව ද ඇහැලේපොල 1815 මාර්තු 18 වන දින මෙම ලියවිල්ලට අත්සන් තැබීමත්, උඩරට පිළිබඳ ආධිපත්‍ය මහා බ්‍රිතාන්‍යයේ රජුට පැවරීම සම්බන්ධයෙන් මෙම සමුළු සභාවේ සිටි ප්‍රභූන් අතරින් අවංකව හා අව්‍යාජව ක්‍රියා කළේ යැයි විශ්වාස කළ හැක්කේ ටික දෙනෙක් පමණක් වීමත්, මෙම ප්‍රභූන් මේ අවස්ථාවේ බලපෑමට අකමැත්තෙන් අවනත වූයේ යැයි ද, ප්‍රතිඵල අනාගතයට තබා ප්‍රශංසනීයත්වයෙන් ඒ මොහොතේ මොවුහු කටයුතු කළේ යැයි ද (Marshall, 1846) අනාවරණය වීමත්, අනුව සැබවින්ම මෙම 1815 ලියවිල්ල ඊට අත්සන් තැබූ ඇතැම් ප්‍රභූවරුන්වත් ගිවිසුමක් ලෙස සැලකුවේ ද යන්න සැක සහිත ය. 1815 ලියවිල්ල සම්බන්ධයෙන් තර්කානුකූල අදහසක් වන්නේ මෙම ඓතිහාසික සිදු වීම ගිවිසුමක ලක්ෂණ පෙන්නුම් කරමින් සිදු වී නොමැති බවයි. බොහෝ විට මෙම ගිවිසුම වූ කලි එක් රටක ස්වෛරී

මහරජෙකු (sovereign of one country) සහ තවත් රටක බලයක් රහිත ප්‍රධානීන් (Unauthorised chiefs) අතර, රජුගේ ආණ්ඩුවේ බරපතලකම හේතුවෙන් ඔහුගේ සිංහාසනය අහිමි කිරීමටත්, ඔහුගේ රාජවංශය සදහට ම මූලෝත්පාටනය (exterminate) කිරීමටත් ඇති වූ නිත්‍ය ගිවිසුමක එකම (ලොකයේ) අවස්ථාව විය හැකි බවට අදහස් පළ වීමෙන් (Marshall, 1846) සහ උඩරට පළාත්වල ආධිපත්‍යය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ පරමාධිපත්‍යයට පැවරී ඇති බවත්, ඒජන්තයන්ට එය පවරා ඔහුගේ බලය ලත් නියෝජිතයන් හරහා ක්‍රියාත්මක කළ යුතු බවත්ටත් ගිවිසුමේ අන්තර්ගතයේ ම සඳහන් වීමත් මෙම ලියවිල්ල ගිවිසුමක හෝ සම්මුතියක ලක්ෂණ සහිත එකඟතාවක් නොවූ බවට අදහස් කළ හැකිය.

'ප්‍රකාශ පත්‍රය' (Proclamation) යන වචනය ඩොයිලි තමන් විසින් ආණ්ඩුකරුට යවන ලද ලිපිවල අවස්ථා ගණනාවකදී යොදා තිබේ. ඇතැම් සමයන්හි 'ප්‍රකාශ පත්‍ර' නැතහොත් රජයේ ප්‍රකාශ ඩොයිලි විසින් කන්ද උඩරට විවිධ ස්ථානයන්හි ප්‍රසිද්ධ කර තිබේ. මේ ප්‍රකාශ සවි කිරීමෙන් හෝ ඇලවීමෙන් ඒවා එළි දක්වා ඇත. (D'Oyly, 1917). වරක් කන්දේ නුවර (මහනුවර) වෙඩි තුනක් පත්තු කළ පුද්ගලයා සොයා දුන් පුද්ගලයෙකුට රික්ස් ඩොලර් 100ක් දෙන බවට ප්‍රකාශ පත්‍රයක් (Proclamation) ප්‍රසිද්ධ කළේය. (D'Oyly, 1917) වරක් ආණ්ඩුකරු විසින් 250ක් 300ක් අතර වූ ස්වදේශීය මිනිසුන් ප්‍රමාණයකගෙන් 13ක් 14ක් වැනි සංඛ්‍යාවකට රජයේ ප්‍රකාශ පත්‍ර ලබා දුන් බව ඩොයිලි වෙත ලිපියකින් දැනුම් දුන්නේය (D'Oyly, 1917).

ප්‍රාථමික මූලාශ්‍රයන්හි ද, ද්විතීයික මූලාශ්‍රයන්හි ද මෙය දේශපාලන සමථයක් බවට අදහස් මතු වේ (Sutherland to D'Oyly, 11 November 1816, SLNA 7/215 ; කුලසේකර, 2019). එනම්, උඩරට පාලන ක්‍රමය සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයන් සිදු කළ ක්‍රමාණුකූල සමථයකි (Brownrrig to Bathurst, 15 March 1815, CO 54/55). උසස් පහත් කුලවලට ලැබෙන අයිතිවාසිකම් හා තහනම් පිළිබඳ ඩොයිලි සඳහන් කරන අවස්ථාවේදී පෙන්වා දෙන්නේ ඒවා ප්‍රතිරෝධක භාවිතයන් බව (antient usages) ප්‍රකාශ පත්‍රයේ (Proclamation) ද පෙනී යන බැවින් මෙය නිරීක්ෂණය කළ යුතු බවයි. (D'Oyly, 1917) රාජධානිය ඈඳා ගැනීම, යා කිරීම, අයිති කර ගැනීම, (annexing Kingdom) යන අදහස් ද, අවනත භාවයට එකතු කර ගැනීම, යටහත්කම නැතහොත් කීකරු කමට තල්ලු කිරීම (on slackness of obedience) යන අදහස් 'ප්‍රකාශ පත්‍රය' යන්නෙන් ද අදහස් කරයි (D'Oyly, 1917).

1815 ලියවිල්ල, ප්‍රකාශ පත්‍රයක් ලෙස ද, සම්මුතියක් ලෙස ද (proclamation or convention) ගිවිසුමක් ලෙස ද හෙන්රි මාෂල් පෙන්වා දෙයි (Marshall, 1846) මෙය ''ඊනියා ගිවිසුමක්'' නැතහොත් ''ප්‍රකාශ පත්‍රයක්'' (so-called treaty or proclamation) ලෙස ද තවත් වරෙක ඔහු සඳහන් කරයි (Marshall, 1846). මෙය ගිවිසුමක් නොවන බවට තර්ක කළ හැකි ප්‍රමාණවත් තොරතුරු ප්‍රථමික මූලාශ්‍රන්හි දක්නට ලැබේ. බ්‍රිතාන්‍යයන් තම විජයග්‍රහණයේ නාමයෙන් මහනුවර රජවරු විසින් අනාදිමත් කාලයක සිට පවත්වාගෙන ආ ක්‍රමය අනුව උඩරටියන් කෙරෙහි ක්‍රියාත්මක කරන ලද අත්තනෝමතික ආධිපත්‍ය කිසි කොන්දේසියක් නොමැතිව ම භාර ගත් බව මෙම සිදුවීමට සමකාලීන පර්යේෂකයන් ම පෙන්වා දීමෙන් අදහස් වන්නේ ගිවිසුමේ නාමයෙන් මෙය ඉදිරියට ක්‍රියාත්මක නොවුණ බවකි (Marshall, 1846). මෙම ලියවිල්ල සම්බන්ධයෙන් නගරයේ පොදු ජනතාවගේ කිසිදු අවධානයක් නොවීය. රජෙකු සමඟ ගිවිසුම්ගත නොවන මෙම රැස්වීමෙන් පසුව වූ එකඟතාව හෝ එකී සිද්ධිදාමය ම එතරම් සැලකිල්ලට ලක් නොකරන ජන පිරිසක් ලෙස මොවුන් කටයුතු කරන්නට ඇති බවක් ද මාෂල් පෙන්නුම් කරනු ලබන මෙම යථෝක්ත අදහස් අනුව පැහැදිලි වේ. එසේ නැතහොත් ලංකාව සම්බන්ධයෙන් සිදු වන මෙවන් කටයුත්තකදී එය සැලකිල්ලට ලක් නොකර සිටීමට මොවුන් අදහස් කළේ මන්ද යන ගැටලුව ඇති වේ. ''ඔබ දැන් රජු සිහසුනෙන් පහ කර තිබේ. මීට වඩා කිසිවක් ඔබගෙන් අපේක්ෂා නොකෙරේ. ඔබට දැන් යා හැකිය'' (Marshall, 1846 ; බස්නායක, 2005). යනුවෙන් මහනුවර ජනතාව බ්‍රිතාන්‍යයන්ට කළා යැයි කියන ප්‍රකාශය මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් මහනුවර ජනයාගේ මහා ගෞරවයක් නොමැති බවක් පෙන්නුම් කරන සාධකයක් වන අතර එකී මානසිකත්වය නගරයේ ජනයා 1815 ලියවිල්ල කෙරෙහි අඩු සැලකිල්ලක් දැක්වීමට ද හේතුවක් වන්නට ඇත (Marshall, 1846 ; Silva, 1953 ; Silva, 2014). ජනතාව මේ සඳහා සෘජුව මැදිහත් නොවූ අතර ජනතාවගේ මෙම හැසිරීම තුළින් ඉස්මතු වන්නේ එය ලාංකිකයන් සම්බන්ධයෙන් සුවිශේෂ වූ ක්‍රියාවලියක් ලෙස ඔවුහු නොසැලකූ බවයි. නැතහොත් ඔවුන්ට ඒ සම්බන්ධයෙන් අවබෝධයක් නොවූ බවයි.

බ්‍රිතාන්‍යයෝ කිසිදු අවස්ථාවක මෙය 'ගිවිසුමක්' නමින් එළි දැක්වූ බවට ප්‍රාථමික මූලාශ්‍රයන්හි සඳහන් නොවීම මේ මතය සම්බන්ධයෙන් ගොඩනැගිය හැකි තවත් තර්කයකි. ආරම්භයේදී උඩරට පිහිටුවන ලද රෙසිඩන්සි යටතේ සිටි සුළු නිලධාරී සංඛ්‍යාව වෙනුවට කල්යත්ම සංඛ්‍යාව වැඩි කිරීමටත් පරිපාලනය තම අභිලාෂයන්ට ක්‍රමාණුකූලව සැලසුම් කිරීමත් 1816 ඔක්තෝම්බර් මස වන විටත් කොමසාරිස් මණ්ඩලයක් නම් මණ්ඩලයක්

උඩරට ප්‍රදේශවල සාමාන්‍ය පරිපාලනය සඳහා පිහිටු වීමත්, කොමසාරිස්වරු පත් කිරීම බ්‍රිතාන්‍ය පාලකයන්ට 1815 දී ඇති වූ ලියවිල්ල ගිවිසුමක් ලෙස පවත්වාගෙන යාමේ අවශ්‍යතාවක් නොවූ බව පෙන්වන සාධකයෝ ය (Sutherland to D'Oyly, 11 November 1816, SLNA 7/215 ; කේ.එම්.පී. කුලසේකර, 2019). සැබවින්ම විද්වත් මත අනුව පැහැදිලි වන්නේ උඩරට ගිවිසුම නීත ක්‍රියාවලියක් ලෙස අදහස් කර ඒ මතින් මෙම ''දැන්වීම් පත්‍රය'' දෙස බලමින් නාමකරණය කර මෙම ලියවිල්ල 'ගිවිසුම' නමින් ව්‍යවහාරයට ගෙන ඇත්තේ ලාංකිකයන් ම බවයි. 'ගිවිසුමක්' ලෙසින් මෙය භාවිතයට ගැනීමට බ්‍රිතාන්‍යයෝ අදහස් නොකළ බවක් මේ ලේඛනය නාමකරණය කිරීම සඳහා 'Proclamation' යන වචනය භාවිතයට ගැනීමෙන් පැහැදිලි කරයි. බ්‍රිතාන්‍යයන් උඩරට දැන්වීම් පත්‍රය ගිවිසුමක් ලෙසින් නොසැලකූ බව මෙම පත්‍රය සම්බන්ධයෙන් කෙරුණු රැස්වීම අවසන් වීමෙන් පසු බ්‍රිතාන්‍ය පාලකයන් මෙන් ම සොල්දාදුවන් පවා රදළයන් හමුදා භටයෙකු තරමකටවත් නොසලකා හැරීමෙන් ගම්‍ය වේ. ඒ අනුව පැහැදිලි කරගත යුත්තේ 1815 සිදු වූ මෙම සිදුවීම ගිවිසුමක් ඇති කර ගැනීමක් හැටියට අර්ථවිග්‍රහ කිරීමට වඩා පාලනය නිරවුල් කරගැනීමේ 'ප්‍රකාශ පත්‍රයක්' ලෙස ව්‍යවහාරයට ගැනීම යුක්තියුක්ත බවයි.

බ්‍රිතාන්‍යයන් ලංකාව යටත් කර ගැනීමෙන් පසු ද 'ප්‍රකාශ පත්‍ර' නිකුත් කෙරිණි. ආණ්ඩුවේ විවිධ ආඥා ප්‍රකාශ කිරීම සඳහා 'ප්‍රකාශ පත්‍ර' නිකුත් කිරීමේ ක්‍රමවේදය භාවිත විය. '1886 'මහමදාගම්කරුවන් විවාහ ලියාපදිංචි කිරීම් ආඥා පනත', '1893 මස් වෙළෙන්දන්ගේ ආඥා පනත' වැනි ආඥා පනත් මෙලෙස නිකුත් විය (Ceylon Government Gazette, August 19, 1898). මෙමගින් හෙළි වන්නේ 'ප්‍රකාශ පත්‍රය' නැතහොත් 'දැන්වීම් පත්‍රය' යන ශීර්ෂය යටතේ ලංකාවේ ද ආඥා පනත් පවා එළිදක්වා ඇති බවයි. 1952 පෙබරවාරි මස ලංකාවේදී, අග්‍රාණ්ඩුකාරවරයා සහ අමාත්‍ය මණ්ඩල සාමාජිකයින් විසින් 'ප්‍රකාශ පත්‍රයක්' අත්සන් කෙරිණි (Tyagi & Kanwal Kishore Bhardwaj, 1969) මෙමගින් බ්‍රිතාන්‍ය මහරැජින ලංකාවේ රැජින ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මෙදින මෙම ප්‍රකාශය කොළඹ පාර්ලිමේන්තු මන්දිරයේ සිට ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ යන භාෂා තුනෙන් පිටත විශාල ජනකායක් වෙත කියවන ලදී. වෙඩි උත්තමාචාරයක් ද සිදු විය. සංගීත කණ්ඩායම් 'දෙවියන් රැජිනට රකීවා' (*God Save The Queen*) සහ නමෝ නමෝ මාතා වාදනය කිරීමෙන් මෙම අවස්ථාව උත්සවශ්‍රීයෙන් සැමරිණි (Jennings & Tambiah, 1952). මෙම අවස්ථාවේදී ලාංකිකයෝ බ්‍රිතාන්‍ය සමඟ ගිවිසුමකට එළඹ නැත. සිදුව ඇත්තේ ඔවුන්ගේ ක්‍රමවේදයට අනුව 'ප්‍රකාශ පත්‍රයක්' ඔස්සේ 1815 වර්ෂයේ සේම බ්‍රිතාන්‍යයන් මෙම රාජ්‍යත්වයට පත්වීම දැනුම් දීමෙන් ලංකාව රැජිනගේ රාජ්‍යයක් බවට පත් කිරීමයි. 1815 දීත් 1952 දීත් බ්‍රිතාන්‍යයන්ගේ මෙම ලේඛන ක්‍රමවේදයත්, ප්‍රකාශන මාදිලියත් සැලකිය යුතු වෙනසකට ලක්ව නොමැත. අවස්ථා දෙකෙහි ම භාවිත කර ඇත්තේ එකම ලිඛිත ප්‍රකාශන මාදිලියයි. එනම්, 'ප්‍රකාශ පත්‍රයක්' මඟින් බ්‍රිතාන්‍යයේ රාජ්‍යත්වය පිළිගැනීමයි. 1815 ලියවිල්ල මඟින් ද සිදු වූයේ අනෙකක් නොව ඒ වන විට සිටි බ්‍රිතාන්‍යයේ තුන්වන ජෝර්ජ් රජුගේ ආධිපත්‍ය පිළිගැනීමයි. 1952 සිදු වූ ආකාරයට ම 1815 දී ද සිදුව ඇත්තේ ගිවිසුම්ගත වීමක් නොව බ්‍රිතාන්‍යයට ලංකා භූමිය අයත් වූ බව නැතහොත් බ්‍රිතාන්‍ය රජුගේ ආධිපත්‍ය පිළිගත් බවට ලාංකිකයන් ඉදිරියේ කියවා තහවුරු කර ලීමයි. එනයින් සැලකීමේදී ජෝන් ඩොයිලි විසින් දක්වන 'නිරවුල් කිරීමේ පනත' යන්නට ද මෙය සමපාත වේ. එනම්, භූමිය පිළිබඳ නිරවුල් කිරීම ය. එනම්, අන් කිසිවක් නොව ලංකා යටත්විජිත භූමිය මහා බ්‍රිතාන්‍යයේ ම භූමියක් බවට පත් කිරීම ය.

බ්‍රිතාන්‍යයන්ගේ කුමන්ත්‍රණ පිළිබඳ ඥානයෙන් පසු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු නිරන්තරයෙන් බ්‍රිතාන්‍යන්ගේ උපක්‍රමික ගිවිසුම් භාවිතය හසු නොවීමට පරෙස්සම් විය. ශ්‍රී වික්‍රම රාජසිංහගේ එම  දැක්ම 1815 වන තෙක් කන්ද උඩරට බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වීමේ මඟ අහුරාලනු ලැබිණි. රජු සමඟ ගිවිසුම්ගත වීමට නොහැකි වූ කල ඔහු බලයෙන් පහ කර දමා උඩරට රදළ ප්‍රධානීන් සමඟ එකතුව එහෙත් ඔවුන්ගේ බලය බිඳ අවනතභාවයේ ලීලාවට හරවා ඔවුන්ගෙන් අනුමැතිය ගැනීමක් 1815 දී සිදු විය. මහනුවර පැවති ස්වෛරී පාලනය වෙනස් කිරීමට 1803 දී බ්‍රිතාන්‍යයන් උත්සාහ දරූ අවස්ථාවේ කන්ද උඩරුටියන් ඒ කෙරෙහි දැක්වූ ප්‍රතිචාරත්, මහනුවර රාජ්‍ය මහා බ්‍රිතාන්‍යයේ රජු අතට පත් කිරීමේ කාර්ය බ්‍රිතාන්‍ය හමුදාව විසින් සාර්ථක කර ගත් අවස්ථාවේ කන්ද උඩරුටියන් ඒ කෙරෙහි දැක්වූ ප්‍රතිචාරත්, අතර පැහැදිලි වෙනසක් දක්නට ලැබේ.

ගිවිසුම සම්බන්ධයෙන් මාර්ෂල් උපුටා දක්වන පවෙල් මෙසේ සඳහන් කරයි. ''බ්‍රිතාන්‍යයන් වෙත සීමාන්තික බලතල පවරා දෙන ගිවිසුමකට එකඟතාව පළ කළ බවක් අඟවමින් මහනුවර නායකයන් නිහඬව සිටි අතර බ්‍රිතාන්‍යන් ලබා ගත් ජයග්‍රහණය ඉන්දියාවෙහි දී සාකච්ඡාවට බඳුන් කිරීමට ද නියමිතව තිබුණි. ගිවිසුම අත්සන් කිරීමේ උත්සවයට සහාගිවූවන්ගෙන් කිහිප දෙනෙකු මහනුවර රාජධානියට අයත් භූමි ප්‍රදේශ මහා බ්‍රිතාන්‍ය හා අයර්ලන්ත එක්සත් රාජධානියට පවරා දීමේ අරමුණෙහි අනතර්ගත අව්‍යාජත්වය හා අවංකභාවය මත මෙහෙයවමින් මහනුවර නායකයන් හට ඒ පිළිබඳ ගෞරවය පිරිනැමුණු අතර ඒ පිළිබඳ බලවත් නොකැමැත්තෙන් වුව ද අගය කළ යුතු ගරුත්වයකින් යුතුව ඔවුන්, උද්ගතව තිබුණු අවස්ථාවට අනුකූලව, ඔවුන්ගෙන් අපේක්ෂිත අන්දමින් ප්‍රතිඵල කාලයට භාර කරමින් එසේ ක්‍රියා කළහැයි ද විශ්වාස කෙරිණි. කන්ද

උඩරට ජනතාව ඔවුන්ගේ තක්සේරුව අනුව හොඳම පාලන ක්‍රමය සේ සැලකූ පැරණි රාජ්‍ය නව පාලන තන්ත්‍රයෙන් උඩු යටිකුරු කෙරුණහයි සලකන බවක් පෙණිනි. රට අල්ලා ගැනීමේ හේතුව වශයෙන් ඉදිරිපත් කෙරෙන කාරණය එනම්, එහි වැසියන් පීඩාදායක පාලනයෙන් මුදා ගැනීම සම්බන්ධයෙන් කිව යුත්තේ මෙසේ ය. වඩාත් ප්‍රාථමික යැයි සැලකෙන ජාතීන් විධිමත් කිරීමේ ආවේණික අයිතියක් තමන්ට ඇතැයි ශිෂ්ට යැයි සම්මත ජාතීහු විශ්වාස කරති. ඒ අයිතිය ක්‍රියාත්මක කිරීම පිණිස ඔවුන් අන්තිමේදී ඒ වැසියන්ට එදිරිවාදිකම් කරන්නට ආරම්භ කළේ රට අල්ලා ගැනීමේ මූලික අරමුණ ඇතිව ය. මනුෂ්‍යත්වය, කරුණාව, දායාව යනාදී වර්ණාලේපවලට යටින් වූයේ ප්‍රබල විජිගීෂාව ම බව තර්කානුකූලව සැක කිරීමට හේතු තිබිණි’’ (Powell, 1984). ගිවිසුමක පැවතිය යුතු මූලික ස්වභාවයක් වන්නේ සාමකාමී හා සහජීවන අනාගත පැවැත්මයි (Branch, 2008). එනයින් සැලකීමේදී 1815 දී සකස් වූයේ ගිවිසුමක් නම් එකී ගිවිසුමෙන් පසු නවතමයෙන් ඇති වූ සාමකාමී සහජීවන පැවැත්මක් නොවුණි. 1815 ලියවිල්ල සකස්ව එකඟත්වය ඇති කර ගත් ආසන්නයේ ම ලාංකිකයන් අතර බ්‍රිතාන්‍ය ආණ්ඩු විරෝධී මත පහළ වූ අතර ඒ සම්බන්ධයෙන් ඇතැම් භික්ෂූන්ගේත්, රදළවරුන්ගෙත් සාකච්ඡා ඇති විය.

මෙම 1815 ලියවිල්ල ඔස්සේ පොරොන්දු වී නොතිබූ බවයි (D'Oyly to Sutherland 29 April 1815, SLNA, 6/521). එනම්, පොරොන්දු ක්‍රියවලියක් මේ ලියවිල්ල සම්බන්ධයෙන් දැඩි සේ බල නොපැවැත්වූ බව පෙනේ. මෙම 1815 ලියවිල්ලෙහි කිසිදු අයුරකට පරිපාලනය ඉදිරියට පවත්වාගෙන යාමේදී දෙපාර්ශ්වයට ලැබෙන බලතල හා වගකීම් සම අයුරින් බෙදී යන්නේ කෙසේ ද යන්නට පැහැදිලි බෙදීමක් දැකගත නොහැකිය. ගිවිසුම්ගත වූයේ නම් දෙපාර්ශවය විසින් ඔවුනොවුන් වෙත ඉටු කළ යුතු සහ දෙපාර්ශවය වෙත පැවරෙන බලයත්, වගකීමත් අසමාන නොවන අයුරින් පැවතීම සාමාන්‍ය ලක්ෂණයකි. ලියවිල්ලේ ලාංකිකයන්ට ලැබෙන වරප්‍රසාද හා වගකීම් ප්‍රමාණයත්, ඊට වඩා වැඩි ප්‍රමාණයකින් අභිමි වන දෑ පිළිබඳවත් ඊටත් වඩා වැඩි ප්‍රමාණයකින් බ්‍රිතාන්‍යන්ට ලැබෙන වගකීම් සහ වරප්‍රසාද පිළිබඳවත් දැකගත හැකිය. ලෝකයේ යටත්විජිත පාලනය පැවති 19 වන සියවසේ මුල් භාගයේ යටත්විජිතකරුවන් සහ යටත් ප්‍රදේශ අතර ඇති වූ ගිවිසුම් ලංකාවේ 1815 ලියවිල්ලෙහි දක්නට ලැබෙන ලක්ෂණයන්ට වඩා වෙනස් ගිවිසුම් ලක්ෂණයන් ය.

1815 ලියවිල්ල කියවන විට අසා සිටි රදළයන්ට තමන් සතුව පැවති නෛතික බලය, අධිකරණ බලය, නිලතල, නම්බුනාම සහ වරප්‍රසාද අහිමි වීම පිළිබඳ අවබෝධයක් ඒ අවස්ථාවේ ම ඇති නොවූයේ යැයි සිතිය නොහැකිය. එසේම 4, 8, 10, 11, 12 යන වගන්ති අනුව රදළයන් භුක්තිවිදි වරප්‍රසාද අහිමි වූ බව දක්නට ලැබේ. එහෙත් ඊට විරුද්ධ වීමට හෝ මේ වගන්ති සංශෝධනය කර ගැනීමට බලයක් රදලවරුන්ට නොතිබුණි. 1815 ලියවිල්ල මඟින් උඩරට පැවති සිංහල චාරිත්‍ර පදනම් කර ගත් යුක්තිය ඉටු කිරීමේ ක්‍රියාවලිය නොසලකා හැරිණි. 7වන වගන්තිය අනුව මරණ දඩුවම සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා ඒජන්තවරයෙකු හරහා ආණ්ඩුකරු හෝ ලොයිතන් ආණ්ඩුකරුගේ අනුමැතිය ලබා ගත යුතුය. 9 වන වගන්තිය අනුව සිවිල් හා ක්‍රිමිනල් නඩු ඇසීම එංගලන්තයේ රජුගේ අනුමැතිය යටතේ පත් වූ ලංකාවේ නිලධරයන් විසින් සිදු කළ යුතුය. මෙම ලියවිල්ලෙන් ලාංකික ප්‍රභූන් නිශ්චිත බලය පැවරීමක් කළ බව දක්නට නොලැබෙන අතර එවැනි බලය පැවරිය හැකි විධිමත් පරිදි බලයට පත් වූ පිළිගත් රාජ්‍ය නායකයෙක් ලංකාවේ පාලනය තුළ ද සිටියේ නැත. ඒ අනුව බ්‍රිතාන්‍යයන් ලංකාවේ බලයේ සිටි රජුගේ බලය තවදුරටත් ඉදිරියට නොපැවතීම සඳහා අවශ්‍ය කොන්දේසි ඇතුළත් කර ‘ප්‍රකාශ පත්‍රයක්’ ලෙසින් නියෝගයක් ලබා දී ඇති බව ලියවිල්ලේ අන්තර්ගතයෙන් පැහැදිලි වේ. ලංකාවේ රදලවරුන්ට අයිති විය යුතු ප්‍රදේශ හා බ්‍රිතාන්‍ය පාලකයන්ට අයිති ප්‍රදේශ පිළිබඳ බෙදීමක් සිදුව නැති අතර ලංකාව යටත්විජිතයක් බවට පත් කර ගැනීම මත එවන් බෙදීමක් සම්බන්ධයෙන් හෝ වෙනත් කොන්දේසියක් සම්බන්ධයෙන් ගිවිසුමක්ගත වීමට බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය වී යැයි සැලකිය නොහැකිය. ඒ බව පූර්වෝක්ත බ්‍රවුන්රික්ගේ ලිපිවල ඇතුළත් වන ඔහුගේ අභිප්‍රායන් අනුව වඩාත් නිරවුල්ව තහවුරු වේ.

බ්‍රිතාන්‍යයන් මේ කවරාකාරයෙන් හෝ ස්වකීය බලය ලංකාව කෙරෙහි යොදවමින් සිදු කළේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය පුනර්ජීවනය කළ ගතානුගතික පාලන තන්ත්‍රයක් අංග සම්පූර්ණ කිරීම ය (Bayly, 1989). ඒ අනුව මොවුහු බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය තුළ ජාතිකවාදයේ යටත් ස්වරූපයන් පෝෂණය කළහ. ආගම සම්බන්ධ කාරණාවලදී බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු සුපරික්ෂාකාරී වුව ද දේශපාලනය හැසිරවීමේ මෙවලමක් ලෙස ඉංග්‍රීසිකරණය (ඉංග්‍රීසි පන්නයට හැරවීම - anglicization) ඔවුහු නතර නොකළහ (Bayly, 1989). මෙය බොහෝ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයේදී මොවුන් අනුගමනය කළ උපක්‍රමික පිළිවෙතකි. ඉන්දියාවේ මුල් යටත් විජිත පාලනයේ නෛතික හා සංඛ්‍යානමය පියවරයන් දේශීය පාලන ක්‍රම යටතේ වඩාත් ද්‍රවශීල සහ වඩා න්‍යායික වූ ‘සැබෑ’ කුල ඒකක වෙන් කිරීමට සහ වැඩි කිරීමට නැඹුරු විය. ලංකාවේදී බ්‍රිතාන්‍යයන්ගේ මෙම ක්‍රමවේදය මඟින් මුදල් භෝග ව්‍යාප්තිය (expansion of cash-cropping) මඟින් ගෝත්‍රික (දකුණු ඉන්දීය ශ්‍රමිකයන් ආදී පහළ ජන සමාජයේ පුද්ගලයන්) සහ ආන්තික ජනතාව යටත් කර ඔවුන් ‘පහත් කුල’ (low castes) බවට පත් කළේය.

1815 දී එකඟතා ප්‍රකාශයක් මඟින් බ්‍රිතාන්‍යන් අතට පත් කළ ද කෙටි කලකින් (වසරක් ගතවීමටත් පෙර) බ්‍රිතාන්‍යන් විසින් ලාංකිකයන් සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්තියේ වෙනස්කම් නිර්මාණය විය. උත්සන්න වූ එම ප්‍රතිපත්තියට විරුද්ධව දේශීය රදල පංතිය භික්ෂූන් වහන්සේ හා පොදු මහජනයා නැඟී සිටීම 1818 වන විට සිදු විය. 1815 රජුට විරුද්ධව කරන ලද සටන ජය ගැනීමෙන් පසු බ්‍රිතාන්‍ය සේනාවන් ගෙවල්, පන්සල් කිහිපයක් කොල්ලකෑම හා පන්සල්වල සිටි අලි ඇතුන් කොල්ල කෑම බලය ලබා ගත් විගස ම බ්‍රිතාන්‍යයන් සිය පාලනය තම අභිතය පරිදි ක්‍රියාවේ යොදවන බවට වූ සංකේතයන් විය. 1815 මාර්තු 2 වන දින මුළු රට ම බ්‍රිතාන්‍ය යටත්විජිතයක් වීම බ්‍රිතාන්‍ය ආක්‍රමණයේ ප්‍රතිඵලයක් පමණක් ම නොව ලුතිනන් ජනරල් බ්‍රවුන්රිග් හා කන්ද උඩරට ජන නායකයන් හා භික්ෂූන් වහන්සේ සමඟ ඇති වූ ගෞරවාන්විත ''ප්‍රකාශ පත්‍රයක්'' ස්ථාපිත වීමේ ප්‍රතිඵලයක් බව දක්නට ලැබේ.

**නිගමනය**

1815 ගිවිසුම නමින් ප්‍රචලිත 'ප්‍රකාශ පත්‍රය'' යනු මහා බ්‍රිතාන්‍යයේ රජු නියෝජනය කළ ලංකාවේ ආණ්ඩුකරු මුල් කර ගත් බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ලංකා භූමිය බ්‍රිතාන්‍ය වෙත පවරා ගත් බවට වන හෙළිදරව්වයි. "Proclamation" යන්න ''ප්‍රකාශ පත්‍රය'', ''දැන්වීම් පත්‍රය'', 'නිවේදනය' යන්න අරුත් ගන්වන අතර "Act of Settlement" යන්න ''නිරවුල් කිරීමේ පනත'', ''බේරුම් කිරීමේ පනත'', ''ස්ථාපන පනත'', ''ජනාවාස පනත'', යනුවෙන් පදරුත් ගැන්විය හැකිය. 'සම්මුතිය' යන යෙදුමට පොදු සහ නිශ්චිත අර්ථයක් තිබිය යුතුය. එවැන්නක් 1815 ලියවිල්ලෙන් උද්දීපනය නොවේ. 'සම්මුතිය' යන්න 'ගිවිසුමක්' ය යන අදහස මත පිහිටා 1815 ලියවිල්ල ගිවිසුමක් ලෙස සම්මුතිය යන පදයට සමාන කර භාවිත වේ. එහෙත් එය නිවැරදි ම භාවිතය නොවේ. ලියවිල්ල සම්බන්ධයෙන් ලංකා පාර්ශවයෙන් පොදු ජනතාව නියෝජනය කරමින් ප්‍රභූන් ගණනාවක් අත්සන් තැබීමත් ඒ වෙනුවට බ්‍රිතාන්‍ය මහරජු නියෝජනය කරමින් මෙරට ආණ්ඩුකරු සිටින බවට සඳහනක් පමණක් ගිවිසුම ආරම්භයේ දැකගන්නට ලැබීමත්, ලාංකික ප්‍රභූන්ගේ අත්සන් පැවතිය ද බ්‍රිතාන්‍ය පර්ශ්වයේ බලධරයන්ගේ අත්සන් පිළිබඳ පැහැදිලි බවක් නොවීමත් මේ සම්බන්ධයෙන් විමසුමට බඳුන් කළ යුතු විශේෂතාවන් ය.

''ප්‍රකාශ පත්‍රය'' සහ 'ප්‍රකාශනය' අතර වෙනස පවතින්නේ ඒවායේ අදාළ අර්ථයන් සහ භාවිතයේ සන්දර්භය තුළ ය. නිල ප්‍රකාශයක් ප්‍රකාශ කිරීමට වචන දෙක ම භාවිතා කරන අතර, ප්‍රකාශ පත්‍රය යන්න සාමාන්‍යයෙන් රාජ්‍ය නිලධාරියෙකු හෝ නායකයෙකු විසින් කරන ලද වඩාත් උත්කර්ෂවත් හෝ උත්සවාකාර නිවේදනයක් (grandiose or ceremonial announcement) සමඟ සම්බන්ධ වේ. මෙම වචන දෙක ම 1815 ලියවිල්ල සඳහා භාවිත කර තිබේ. 1815 ලියවිල්ල නෛතික ප්‍රකාශයක් මිස ඍජුව ම 'ගිවිසුමක්' යැයි නාමකරණය කළ නොහැකිය. නීති ක්‍රියාවලියක් ලෙස සැලකීමෙන් මෙම ලියවිල්ල 'ගිවිසුමක්' යැයි සඳහන් ඉතිහාසකරණයක් සහ ජනගත ව්‍යවහාරයක් පැවතිය ද 1815 දී ලංකාවේ සිදු වීම සහ යටත්විජිත යුගයේ බ්‍රිතාන්‍ය පාලකයන් අනුගමනය කළ ප්‍රකාශන මාධ්‍යයන්හි ස්වභාවය, එකී ලේඛනයෙහි දක්නට ලැබෙන සන්දර්භය, ලේඛන ලක්ෂණ මෙන් ම ලේඛනයේ අරමුණු, යටත්විජිත යුගයේ මෙන් ම එකී ලේඛන මාධ්‍යයන් පසුකාලීනව බ්‍රිතාන්‍යයේත්, බ්‍රිතාන්‍ය ක්‍රමයට හුරු වූ ලෝකයේ සෙසු රටවලත් භාවිත වූ ආකාරය සලකා බැලීමේදීත්, 'Treaty' (ගිවිසුම) හෝ 'Convention' (සම්මුති) නමින් ම මෙම ලියවිල්ල නාමකරණය නොකර 'Proclamation' (දැන්වීම් පත්‍රය) නමින් නාමකරණය කළේ මන් ද යන්නත්, 1815 ලංකාවේ කන්ද උඩරටදී ඇති වූ ලියවිල්ල ගිවිසුමක් යැයි නාමකරණය කිරීමට ඇති බාධාවන් ය. කන්ද උඩරට පළාත් සම්බන්ධයෙන් වූ නිරවුල් කිරීමේ ප්‍රකාශ පත්‍රයක් ලෙස මෙය සැලකීම වඩාත් යෝග්‍ය බවට හැඟෙන සාධක බහුල ය.

ආණ්ඩුකරුගේ ප්‍රධානත්වයෙන් සම්මේලනයක් කැඳවා බ්‍රිතාන්‍ය පාලකයන්ගේ ස්ථාවරත්වය ''ප්‍රකාශ පත්‍රයක්'' මඟින් එළිදැක්වූ බව මෙහිදී අදහස් කළ හැකිය. කන්ද උඩරට පළාත් සම්බන්ධයෙන් භූමිය නිරවුල් කර ගැනීම, එනම්, යටත්විජිත ලංකා භූමිය බ්‍රිතාන්‍ය මවුරට වෙත පවරා ගැනීම පිළිබඳ සකස් කරන ලද මෙම ලියවිල්ලට ''1815 ගිවිසුම'' යනුවෙන් සඳහන් කිරීමට වඩා නිවැරදි ලෙසින් ''1815 බේරුම් කිරීමේ පනත'', ''1815 බේරුම්කරණ පනත පිළිබඳ සම්මේනයේ ප්‍රකාශ පත්‍රය'', ''1815 නිරවුල් කිරීමේ පනත'', ''1815 නිරවුල් කරන පනත පිළිබඳ සම්මේලනයේ එකඟතා ප්‍රකාශ පත්‍රය'', ''1815 දැන්වීම් පත්‍රය'', ''1815 සම්මුති පත්‍රය'' හෝ ''1815 පොදු එකඟතාව'' යන නාමකරණයන් භාවිත කළ හැකිය.

## References


අබයසිංහ, ටි., දේවරාජ, ශ්‍රී., සහ සෝමරත්න, ජී. පී. වී. (1977). උඩරට රාජධානිය. ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම.

කුලසේකර, කේ. එම්. පී. (2019). 1815 උඩරට ගිවිසුම හා 1818 බ්‍රිතාන්‍ය විරෝධී සටන. මහවෙල රතනපාල හිමි ඇතුළු තවත් අය (සංස්.). 1815 උඩරට ගිවිසුම හා මල්වතු මහා විහාරය, 446-450.

පෙරේරා, ඒස්. ජී. (1960). වී. පර්නියෝලා පියතුමා. (සංස්.). පී. බී. ජේ. හේවවසම් (අනුවාදක). ලංකා ඉතිහාසයඃ බ්‍රිතාන්‍ය

නිදහස් යුග 1796-1956. ලේක්හවුස් සහ සමාගම.

බස්නායක, එච්. ටී. (2005). ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය 3. ගොඩගේ සහ සමාගම.

මැන්දිස්, ජී. සී. (1963). ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය. ඇපොතිකරීස් සමාගම.

විමලානන්ද, ටී. (2010). උඩරට මහ කැරැල්ල. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය විතීයභාගය, (1999). වැලිවිටියේ පණ්ඩිත සොරත ස්වාමීන්ද්‍රයන් වහන්සේ. *ගිවිස්, ගිවිස, ගිවිස්නා, ගිවිසුම්, ගිවිසුම් පත්, සම්මත, සම්මති, සම්මුති.* (චච. 333-338, 1048-1049). එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සිල්වා, එම්. යූ. ද. (1996). ලංකාවේ ආණ්ඩුක්‍රම සහ ජාතික ව්‍යාපාරය. අභය මුද්‍රණ ශිල්පියෝ.

සිල්වා, සී. ආර් ද. (1958). බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව. ඇපොතිකරීස් සමාගම.

*Alcock Convention | Sino-British Treaty, Diplomatic Relations & Trade | Britannica.* (n.d.). Www.britannica.com. https://www.britannica.com/event/Alcock-Convention

*Anglo-Burmese Wars | British-Myanmar history | Britannica.* (n.d.). Www.britannica.com. https://www.britannica.com/event/Anglo-Burmese-Wars#ref260642

Bayly, C. A. (1989). *Imperial Meridian: The British Empire and the World 1780-1830* (Vol. i, pp. 193–209). Routledge. https://doi.org/10.4324/9781315836379

*Berne Convention | copyright law.* (n.d.). Encyclopedia Britannica. https://www.britannica.com/topic/Berne-Convention

Borrows, John. “Wampum at Niagara: The Royal Proclamation, Canadian Legal History, and Self-Government.” In *Aboriginal and Treaty Rights in Canada: Essays on Law, Equality, and Respect for Difference.* Vancouver: University of British Columbia Press, 1997. pp. 155-172.

Borrows, John. 1994: 559-560; https://www.commonword.ca/FileDownload/25593/the_treaty_of_niagara.pdf

Branch, G. of C. I. and N. A. C. C. (2008, November 3). *Treaties and agreements.* Www.rcaanc-Cirnac.gc.ca. https://www.rcaanc-cirnac.gc.ca/eng/1100100028574/1529354437231#chp3

Bussche, C. L. De. (n.d.). *Letters on Ceylon; particularly relative to the Kingdom of Kandy.* J. J. Stockdale.

Cambridge Dictionary. (2019). *CONVENTION | meaning in the Cambridge English Dictionary.* Cambridge.org. https://dictionary.cambridge.org/dictionary/english/convention

Cambridge Dictionary. (2023a, November 8). *declaration of means.* @CambridgeWords. https://dictionary.cambridge.org/dictionary/english/declaration-of-means

Cambridge Dictionary. (2023b, November 8). *treaty.* @CambridgeWords. https://dictionary.cambridge.org/dictionary/english/treaty?q=Treaty+

Canada, G. of C. I. and N. A. (2013, June 4). *250th Anniversary of the Royal Proclamation of 1763.* Www.rcaanc-Cirnac.gc.ca. https://www.rcaanc-cirnac.gc.ca/eng/1370355181092/1607905122267#a1

Ceylon Government Gazette, 6 March 1815

*convention noun - Definition, pictures, pronunciation and usage notes | Oxford Advanced American Dictionary at OxfordLearnersDictionaries.com.* (2023). Oxfordlearnersdictionaries.com. https://www.oxfordlearnersdictionaries.com/definition/american_english/convention

*Convention of Akkerman | Treaty, Russo-Ottoman, 1826 | Britannica.* (n.d.). Www.britannica.com. https://www.britannica.com/topic/Convention-of-Akkerman

*Convention of Gastein | Austrian-Prussian, 1820s, Peace Treaty | Britannica.* (n.d.). Www.britannica.com.

https://www.britannica.com/event/Convention-of-Gastein

*Convention of Malvana | Portuguese-Ceylonese, Diplomatic, Treaty | Britannica.* (n.d.). Www.britannica.com. https://www.britannica.com/event/Convention-of-Malvana

*Convention of Wadgaon | Marathas, Treaty, 1779 | Britannica.* (n.d.). Www.britannica.com. https://www.britannica.com/event/Convention-of-Wadgaon

Davies, C. (2022, September 10). Charles formally proclaimed King by privy council. *The Guardian.* https://www.theguardian.com/uk-news/2022/sep/10/charles-formally-proclaimed-king-by-privy-council

Davy, J. (1821). *An Account of the Interior of Ceylon and of Its Inhabitants with Travels in That Island.* A. & R. Spotswood.

*declaration noun - Definition, pictures, pronunciation and usage notes | Oxford Advanced Learner's Dictionary at OxfordLearnersDictionaries.com.* (2023). Oxfordlearnersdictionaries.com. https://www.oxfordlearnersdictionaries.com/definition/english/declaration?q=declaration

*Declaration vs. Proclamation | the difference - CompareWords.* (n.d.). Comparewords.com. https://comparewords.com/declaration/proclamation

*Definition of convention | Dictionary.com.* (n.d.). Www.dictionary.com. https://www.dictionary.com/browse/convention

*Definition of CONVENTION.* (n.d.). Www.merriam-Webster.com. https://www.merriam-webster.com/dictionary/convention

*Definition of DECLARATION.* (n.d.). Www.merriam-Webster.com. https://www.merriam-webster.com/dictionary/declaration

*Definition of HOLD.* (n.d.). Www.merriam-Webster.com. https://www.merriam-webster.com/dictionary/hold

*Definition of proclamation | Dictionary.com.* (n.d.). Www.dictionary.com. https://www.dictionary.com/browse/proclamation

*Definition of SUBSCRIBE.* (2023, November 4). Www.merriam-Webster.com. https://www.merriam-webster.com/dictionary/subscribe

*Definition of treaty | Dictionary.com.* (n.d.). Www.dictionary.com. https://www.dictionary.com/browse/treaty

*Definition of TREATY.* (2019). Merriam-Webster.com. https://www.merriam-webster.com/dictionary/treaty

Diary of Mr. John D'Oyly. (1917). (H. W. Codrington, Ed.). Apothecaries Co.Ltd.

Dicey. (1902). *Introduction to the Study of the Law of the Constitution (6th Ed.)*

Famer, B. A. (1963). *Ceylon, A Divided Nation.* Issued under the auspices of the Institute of Race Relations: Oxford University Press.

Fenech, L. E., & McLeod, W. H. (2014). *Historical Dictionary of Sikhism.* Rowman & Littlefield.

Foster, H. "Canada: 'Indian Administration' from the Royal Proclamation of 1763 to Constitutionally Entrenched Aboriginal Rights." In *Indigenous Peoples' Rights in Australia, Canada, and New Zealand*, Paul Havemann [Ed.]. Auckland: Oxford University Press, 1999. pp. 351-377

Google. (2023). *Google.* Google.com; Google. https://www.google.com/

Governor's Speech of on 20 May 1816. (1825). *A collection of Advertisements, Minutes, General Rules and Circular Letters.*

Hartford Convention | United States history | Britannica. (2020). In *Encyclopædia Britannica*. https://www.britannica.com/event/Hartford-Convention

History.com Editors. (2018, August 21). *Proclamation of 1763*. History; A&E Television Networks. https://www.history.com/topics/native-american-history/1763-proclamation-of https://dictionary.com/browes/declaration

Hunt, W., & Phillips Academy, O. W. H. L. (1905). The political history of England. In *Internet Archive*. London, New York, Longmans, Green. https://archive.org/details/politicalhistory0008hunt/

*International agreement | international relations*. (n.d.). Encyclopedia Britannica. https://www.britannica.com/topic/international-agreement

Jennings, S. W. I., & Tambiah, H. W. (1952). *The Dominion of Ceylon, Development of its Laws and Constitution*. Stevens.

Jennings, Sir Ivor (1953), *The Constitution of Ceylon*, Indian Branch, Oxford University Press.

John Malcolm (1826). The Political History of India, From 1784 - 1823. (Vol. i). London: John Murray, Albemarle- Street P. 1.

*June 1657: An Act for the assuring, confirming, and setling of Lands and Estates in Ireland. | British History Online*. (n.d.). Www.british-History.ac.uk. Retrieved November 9, 2023, from http://www.british-history.ac.uk/no-series/acts-ordinances-interregnum/pp1100-1110

*Kandyan Convention | British Rule, Ceylon, Colonialism | Britannica*. (n.d.). Www.britannica.com. Retrieved November 10, 2023, from https://www.britannica.com/event/Kandyan-Convention

Kannagara, P.D. (1966). *The History of the Ceylon Civil Service 1802-1803*. Dehival: Tisara Prakasakayo.

Malcolm, J. (1826). *Political History of India, from 1784 to 1823*. (Vol. 1). John Murray.

Marshall, H. (1846). *Ceylon*. London: William h. Allen and Co.

Mehta, J. L. (2005). *Advanced study in the history of modern India 1707-1813*. New Dawn Press, Inc.

Mendis, G.C. (1956). *The Colebrooke-Cameron Papers*. (Vol.II). pp. 227-230

*Merriam-Webster Dictionary*. (2023). Merriam-Webster.com. https://www.merriam-webster.com/dictionary/private%20treaty

Micheál Ó Siochrú. (2009). *God's executioner: Oliver Cromwell and the conquest of Ireland*. Faber.

*Mob Convention | United States History | Britannica*. (n.d.). Www.britannica.com. https://www.britannica.com/event/Mob-Convention

*Montserrat -- the island in the Caribbean where St Patrick's Day is a holiday*. (2012, March 17). Independent.ie. https://www.independent.ie/life/montserrat-the-island-in-the-caribbean-where-st-patricks-day-is-a-holiday/26833297.html

Myers, L. (n.d.). *Research Guides: Public International Law: A Beginner's Guide: International Conventions*. Guides.loc.gov. https://guides.loc.gov/public-international-law/international-conventions

Naravane, M. S. (2018). *Battles of the honourable East India Company: making of the Raj*. A.P.H. Publishing Corporation.

*No. O.* (2018, May 21). *encyclopedia article*. Wikisource.org; Wikimedia Foundation, Inc. https://en.wikisource.org/wiki/1911_Encyclop%C3%A6dia_Britannica/Proclamation

Palmier, L., & Anderson, B. R. O'G. (1964). Review of Some Aspects of Indonesian Politics under the Japanese

Occupation: 1944-1945. *Journal of Southeast Asian History*, *5*(2), 215–218. https://www.jstor.org/stable/20067518

Pieris, P. E. (1995). *Sinhalē and the Patriots 1815-1818*. Navrang.

Political convention | American politics | Britannica. (2019). In *Encyclopædia Britannica*. https://www.britannica.com/topic/political-convention

Powell, G. (1973). *The Kandyan War*. Navarang.

*Preamble (Hansard, 6 February 1952)*. (n.d.). Api.parliament.uk. https://api.parliament.uk/historic-hansard/lords/1952/feb/06/preamble

*Proclamation of the Accession of His Majesty The King | The Proclamation of the Accession of His Majesty The King will be held on the steps of Parliament House on Sunday 11 September 2022. | By SA Government | Facebook*. (n.d.). Www.facebook.com. Retrieved November 16, 2023, from https://www.facebook.com/SAGovernment/videos/567649575155098

*Proclamations of Accessions of British Sovereigns (1547-1952)*. (n.d.). Www.heraldica.org. https://www.heraldica.org/topics/britain/brit-proclamations.htm#Introduction

*Project South Asia*. (2008, November 22). Web.archive.org. https://web.archive.org/web/20081122125838/http://www.mssu.edu/projectsouthasia/history/primarydocs/Tipu_Sultan/TreatyofMangalore1784.htm

Radhey Shyam Chaurasia. (2004). *History of modern China*. Atlanti.

Rajayyan, K. (1970). British Annexation of the Carnatic, 1801. *Proceedings of the Indian History Congress*, *32*, 54–62. https://www.jstor.org/stable/44138505

*Royal Proclamation, 1763*. (n.d.). Indigenousfoundations.arts.ubc.ca. https://indigenousfoundations.arts.ubc.ca/royal_proclamation_1763/#:~:text=The%20Royal%20Proclamation%20was%20initially

Sauer, E. (2014). *Milton, toleration, and nationhood*. Cambridge University Press.

Sharma, P. (2023, March 10). *Treaty of Salbai - End of 1st Anglo-Maratha War*. History Flame. https://historyflame.com/treaty-of-salbai/

Silva, C. R. de. (1953). *Ceylon Under the British Occupation, 1795-1833*. Colombo : the Colombo Apothecaries' Co., LTD.

Silva, K. M. de. (2014). *A History of Sri Lanka*. Vijaya Yapa Publications.

Skeen, W. (1853). *A Collection of Legislative Acts of the Ceylon Government*. (Vol. i). Government Printer.

Somasundaram, R. (2008). *British Infiltration of Ceylon (Sri Lanka) in the Nineteenth Century*.

Southern Baptist Convention | American religious organization. (2019). In *Encyclopædia Britannica*. https://www.britannica.com/topic/Southern-Baptist-Convention

States., U., & James Arthur Finch. (1904). *Catalog of the Library of the Department of Justice, to September 1, 1904*.

Stephen, J. (1868). *Mr. Serjeant Stephen's New Commentaries The Laws Of England* (Vol. Ii, P. 528). Butterworths, 7, Fleet Street.

Strathern, A. (2017). The digestion of the foreign in Lankan history, c. 500–1818. In *Sri Lanka at the Crossroads of History* (pp. 216–238). University College London. https://discovery.ucl.ac.uk/id/eprint/1557938/1/Sri-Lanka-at-the-Crossroads-of-History.pdf

Vimalananda, T. (1973). The British Intrigue in the Kingdom of Ceylon. M. D. Gunasena.

Vimalananda, T. (1970). The Great Rebellion of 1818: The Story of the First War of Independence and the Betrayal of the Nation. M. D. Gunasena.

The Editors of Encyclopaedia Britannica. (2019). Seneca Falls Convention | United States history. In *Encyclopædia Britannica*. https://www.britannica.com/event/Seneca-Falls-Convention

The Editors of Encyclopedia Britannica. (2017). Annapolis Convention | Overview & Significance. In *Encyclopædia Britannica*. https://www.britannica.com/event/Annapolis-Convention

The Editors of Encyclopedia Britannica. (2018). National Convention | French history. In *Encyclopædia Britannica*. https://www.britannica.com/topic/National-Convention

The Editors of Encyclopedia Britannica. (2019). Constitutional Convention | History & Compromises. In *Encyclopædia Britannica*. https://www.britannica.com/event/Constitutional-Convention

*Treaty and convention, how these two are different? - MySeaTime*. (n.d.). Www.myseatime.com. https://www.myseatime.com/blog/detail/what-is-the-difference-between-treaty-and-convention

*treaty noun - Definition, pictures, pronunciation and usage notes | Oxford Advanced Learner's Dictionary at OxfordLearnersDictionaries.com*. (2022). Oxfordlearnersdictionaries.com. https://www.oxfordlearnersdictionaries.com/definition/english/treaty?q=treaty

*Treaty of Alinagar | Great Britain-India [1757] | Britannica*. (n.d.). Www.britannica.com. https://www.britannica.com/event/Treaty-of-Alinagar

*Treaty of Bassein | United Kingdom-Bājī Rāo II [1802] | Britannica*. (n.d.). Www.britannica.com. https://www.britannica.com/event/Treaty-of-Bassein

Treaty of Sagauli | British-Nepalese history [1816]. (2019). In *Encyclopædia Britannica*. https://www.britannica.com/event/Treaty-of-Sagauli

Tyagi, A. R., & Kanwal Kishore Bhardwaj. (1969). *The Working of Parliamentary Democracy in Ceylon*. Delhi : Sultan Chand.

Tzu, S. (1910). *The Art of War* (L. Giles, Ed.). Luzac & Co.

UK Parliament. (2020). *Conventions - Glossary page*. UK Parliament. https://www.parliament.uk/site-information/glossary/conventions/

*United Nations Treaty Collection*. (2009). Un.org. https://treaties.un.org

United Nations. (n.d.). *United Nations Treaty Collection*. Treaties.un.org. https://treaties.un.org/Pages/overview.aspx?path=overview/definition/page1_en.xml

Walker, M. P. (1962). Some Aspects of Indonesian Politics under the Japanese Occupation: 1944–1945. By Benedict R. O'G. Anderson. Ithaca: Cornell University, Modern Indonesia Project, Interim Report Series, 196. 126. $3.00. *The Journal of Asian Studies*, *21*(04), 563–564. https://doi.org/10.1017/s0021911800113063

Whelpton, J. (2008). *A history of Nepal*. Cambridge Univ. Press.

Wilson, J. (2016). Reappropriation, Resistance, And British Autocracy in Sri Lanka, 1820–1850. *The Historical Journal*, *60*(1), 47–69. https://doi.org/10.1017/s0018246x16000091